2022 පෙබරවාරි • 239 කලාපය

රණවිරුවා

74 ජාතික නිදහස

අභිමානවත් සැමරුමට ගෞරවනීය සම්ප්‍රාප්තිය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

74 ජාතික නිදහස

නිදහස් බිමේ මදහස් නැගූ අභිමන් දිනය

"රුපු තෙද බිඳි රණවිරු බලමුළු එක්ව පෑ පෙළහර මෙවර නිදහස් දින සැමරුම අභිමානවත් හා අරුත්බර එකක් බවට පත්කරන ලද්දේ දෑ හිතකාමී සැමගේ නෙතට සතුටු කඳුලක් එක්කරමිනි"

මවුබිමේ සෞභාග්‍යය, සාමය, සංහිඳියාව සහ ස්ථාවරත්වය වෙනුවෙන් සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ අධිෂ්ඨානශීලී කැපවීම තවදුරටත් පිළිබිඹු කරමින් "අභියෝග ජයගත් අසිරිමත් හෙට දිනක් - සෞභාග්‍යමත් මවුබිමක්" යන තේමාව පෙරටු කරගනිමින් 74 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සවය ඉකුත් පෙබරවාරි 04 වන දින නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේදී අභිමානවත් අයුරින් සැමරිණ.

මෙම ඓතිහාසික අවස්ථාවට සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්, අයෝමා රාජපක්ෂ මැතිනිය සහ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්, ශිරන්ති රාජපක්ෂ මැතිනිය ප්‍රධානත්වය දැරූහ. තවද භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික පූජකවරු, රාජ්‍ය තාන්ත්‍රිකයින්, අමාත්‍යවරු, අමාත්‍යාංශ ලේකම්වරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ඇතුළු ආරක්ෂක අංශ ප්‍රධානීන්, රාජ්‍ය හා සිවිල් සම්භාවනීය අමුත්තන් ඇතුළු ආරාධිතයින් රැසක් ද ඊට එක්වූහ.

ත්‍රිවිධ හමුදා නිලධාරීන්, සෙසු නිලයන්, පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්, සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින්, ජාතික ශිෂ්‍යභට බලකායේ සාමාජිකයන්, සේවයේ නිරතව සිටින, විශ්‍රාමික හා රණක්ෂිතයට පත් රණවිරුවන් සේම පාසල් සිසු සිසුවියන් ඇතුළු 6500 ක ගෙන් සැදුම්ලත් වර්ණවත් පෙළපාලිය මේජර් ජෙනරාල් ඩී.ජී.එස් සෙනරත් යාපා ආර්.ඩබ්ලිව්.පී. ආර්.එස්.පී. එන්.ඩී.යූ ගේ අණදීම යටතේ මෙවර නිදහස් චතුරශ්‍ර පරිශ්‍රය ප්‍රොඩත්වයෙන් බැබළවූහ.

74 වන ජාතික නිදහස් දින අභිමානවත් බව තවදුරටත් පිළිබිඹු කරමින් එම පෙළපාලිය සඳහා යුද්ධ, නාවික හා ගුවන් හමුදාවන් නියෝජනය කරමින් ගොඩබිමෙහි මෙන්ම ජලයේ ද සිදුකරනු ලබන ක්‍රියාන්විතයන් සඳහා භාවිතා කරන සන්නද්ධ රථ රැසක් එක්කර තිබිණි. යුද්ධ හමුදා සාමාජිකයින් විසින් නිෂ්පාදනය කරනු ලැබූ නව යුනිකොබ් (*Unicorb*) රථය ද ප්‍රථම වරට මෙවර නිදහස් දින පෙළපාලියට එක්ව තිබිණ. එසේම, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය වෙතින් නිෂ්පාදනය කරනු ලැබූ "යුනි බෆල්" *Mark II (Uni Buffel)*, "යුනි ඇවලන්" (*Uni Avalon*) රථ සහ අති නවීන බිම්බෝම්බ ප්‍රතිරෝධක ආරක්ෂක රථය වන "යුනිකොබ්" (*Unicorb*) රථය ද මෙම පෙළපාලියේදී ප්‍රදර්ශනය කිරීම විශේෂත්වයකි. එමෙන්ම, අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව පසුගියදා යුද්ධ හමුදාව තුළ ස්ථාපිත කරනු ලැබූ කෘෂිකාර්මික බලකාය ද මෙවර නිදහස් දින පෙළපාලියේ සිය අභිමානවත් ගමනට එක්ව සිටීම කාගේත් අවධානයට බඳුන් විය.

ගංගාරාම විහාරස්ථානයේ නවම් පෙරහැර මංගල්‍යයට එක්ව

හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය අඛණ්ඩව 43 වන වරටත් පවත්වනු ලැබූ නවම් මහා පෙරහැර මංගල්‍යයේ අවසන් මහා පෙරහැර පසුගිය පෙබරවාරි 16 වන දිනට යෙදුණු නවම්පුර පසලොස්වක පොහෝ දින පැවැත්විණි. එහිදී පෙරහැර මංගල්‍යයේ සධාතුක දළදා කරඬුව හස්තිරාජයා මත තැන්පත් කිරීම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියද මෙම අවස්ථාවට සහභාගී වෙමින් සධාතුක ධාතු කරඬුව වෙත මල් පූජාකර ආශිර්වාද ලබාගත්හ.

සුහද හමු රැසක් යුද්ධ හමුදා මූලස්ථානයේදී

ශ්‍රී ලංකාවේ පාකිස්තානු ඉස්ලාමීය ජනරජ මහකොමසාරිස් කාර්යාලයේ අභිනවයෙන් පත්වූ මහකොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) උමාර් ෆාරුක් බුර්කි හිලාල්-ඉ-ඉම්ටියාස් (Umar Farooq Burki Hilal-i-Imtiaz) ඉකුත් පෙබරවාරි 18 වන දින පස්වරුවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම සුහද හමුව අතරතුරදී, දෙරට අතර වසර ගණනාවක් තිස්සේ පවත්නා මිත්‍රශීලී සබඳතා මෙන්ම දෙරට සන්නද්ධ හමුදාවන් අතර පවත්නා පුහුණු වැඩසටහන් ආදිය පිළිබඳ සිහිපත් කෙරිණ.

එහිදී, නව පත්වීම වෙනුවෙන් කොමසාරිස්තුමන් වෙත සිය සුබපැතුම් එක්කළ යුද්ධ හමුදාධිපති එතුමන්ගේ රාජකාරි කටයුතු සඳහා සිය සහයෝගය ලබාදෙන බවට ද පැවසීය. සුහද හමුව අවසානයේ දෙපාර්ශ්වය අතර සංකේතාත්මක සමරු තිළිණ හුවමාරුවක් ද සිදු කෙරිණි.

ඕස්ට්‍රේලියානු ආරක්ෂක දෙපාර්තමේන්තුවේ Global Interests Branch in the International Policy අංශයේ සහකාර ලේකම් ටොම් මැනඩු මහතා (Mr Tom Manadue) පසුගිය පෙබරවාරි 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් අතිගරු ඩේවිඩ් හොලී මහතා (H.E. David Holly), ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් ඉයන් කේන් (Captain Ian Cain) සහ තවත් නිලධාරියකුද එක්ව සිටියහ.

ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් වන කලාපීය අවශ්‍යතා, ආරක්ෂක ගැටළු, ආරක්ෂක සහයෝගීතාව, කොවිඩ් - 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ කටයුතු සහ දකුණු ආසියාතික රටවල් ආශ්‍රිතව දිනෙන් දින වර්ධනය වන ආරක්ෂක සහයෝගීතාවය පිළිබඳව ඔවුහු මෙම හමුවේදී අදහස් හුවමාරු කරගත්හ. තවද, දෙරට අතර පවත්නා සුහෘත්වය තවදුරටත් ශක්තිමත් කරමින් අනාගතයේදී කලාපයේ සාමය පවත්වාගැනීමේ වැදගත්කම ද එහිදී අවධාරණය කෙරිණ.

ශ්‍රී ලංකාවේ නයිජීරියානු මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමදෝරු ඇන්තනි වික්ටර් කුජෝ (*Commodore Anthony Victor Kujoh*) පසුගිය පෙබරවාරි 02 වන දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක නිරත වෙමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. මෙම සුහද හමුව අතරතුර බලශක්තිය, සමුද්‍රීය සහ ආරක්ෂාව සබැඳිව පවතින ද්විපාර්ශ්වික ගිවිසුම් සහ විවිධ මට්ටමේ තාක්ෂණික හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් වන ගිවිසුම් පිළිබඳ අදහස් හුවමාරු කරගනු ලැබීය.

ශ්‍රී ලංකාවට අනුයුක්ත කර ඇති නවදිල්ලියේ පිහිටි ඉන්දුනීසියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමදෝරු දිඩික් කුර්නියාවන් (*Commodore Didik Kurniawan*) පසුගිය පෙබරවාරි 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. වර්ෂ 1952 සිට දෙරට අතර පවතින මිත්‍ර රාජ්‍ය තාන්ත්‍රික, ආගමික හා සංස්කෘතික සබඳතා පිළිබඳව මෙම හමුවේදී සාකච්ඡාවට බඳුන්විය.

ශ්‍රී ලංකාවේ තුර්කි ජනරජයේ තානාපති කාර්යාලයේ හමුදා උපදේශක කර්නල් කාන් ගොක්කායා (*Colonel Can Gokkaya*) පසුගිය පෙබරවාරි 02 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. මෙම සුහද හමුවේදී, ද්විපාර්ශ්විකව වැදගත් වන දෙරටෙහි ආරක්ෂක අවශ්‍යතා, වෙළඳ, වාණිජ කටයුතු සහ තවත් කරුණු රැසක් පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී.

ඉන්දු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා අතර හමුදාමය සහයෝගිතාවය වර්ධනය කෙරේ

ඉන්දු-ශ්‍රී ලංකා යුද්ධ හමුදා අතර දිනෙන් දින වර්ධනය වන ද්විපාර්ශ්වික හමුදාමය සහයෝගිතාවය සහ සුහදත්වය ප්‍රදර්ශනය කරමින් වාර්ෂිකව පවත්වනු ලබන ඉන්දු- ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික සාකච්ඡාව ඉකුත් පෙබරවාරි මස 10 වන දින සිට 12 වන දින දක්වා පුනේ හි පිහිටි ඉන්දීය හමුදාවේ පැරණිතම දක්ෂිණ විධාන මූලස්ථානයේදී 9 වන වරටත් පැවැත්විණ. ඊට එක්වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිස එම සාකච්ඡාවේ ප්‍රතිඵලය, ඵලදායිතාවය සහ ද්විපාර්ශ්වික වශයෙන් කතිකා කරගත් වැදගත් කරුණු පිළිබඳ පසුගිය පෙබරවාරි 21 දින උදෑසන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවී නිල වශයෙන් දැනුම් දුන්හ.

1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද සේවා ලේකම් මේජර් ජෙනරාල් කේටීඒඩීඑස් කොළඹතන්ත්‍රි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී, පුහුණු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී සහ සංඥා බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ඇතුළු ඉන්දු- ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික සාකච්ඡාව සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිස එලෙස යුද්ධ හමුදාධිපති හමුවී ද්විපාර්ශ්විය සබඳතා ශක්තිමත් කරමින් ඉන්දීය හමුදාව විසින් පෙන්වාදුන් වැදගත් කරුණු පිළිබඳව දැනුවත් කළහ.

විරු අභිමන

නිවාස ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ට සමගාමීව, යුද්ධ හමුදාවේ සෑම සෙබළකුටම විශ්‍රාම යාමට ප්‍රථම නිවසක් ඉදිකරදීම සඳහා වූ යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව "විරු අභිමන්" විශේෂ සහනදායී නිවාස ණය යෝජනා ක්‍රමය රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම බැංකුවක් වන මහජන බැංකුව සමඟ එක්ව පසුගියදා ක්‍රියාවට නැංවිණ.

මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සහ මේ සඳහා සම්පත් දායකත්වය ලබාදුන් මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය පෙබරවාරි 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවැති උත්සවයකදී ඒ සඳහා වූ ගිවිසුම භාරදුන්නේය.

මෙම නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන්ට වසරකට 9% ක පොලියට උපරිම වශයෙන් රුපියල් මිලියන 15 ක් සහ නිවස ඉදිකිරීමට නියමිත ඉඩමේ වටිනාකම සහ යෝජිත නිවස ඉදිකිරීමේ ඇස්තමේන්තු වටිනාකම මත 75% ක ණය මුදලක් ලබා ගත හැක. එසේ නොමැති, දැනටමත් ඉදිකර ඇති නිවසක් මිලදී ගන්නා, අයදුම්කරුවන්ට ඇස්තමේන්තුගත වටිනාකමින් 75% ක් ලබාගත හැක. එසේම, නිවාස සංකීර්ණයක නිවසක් මිලදී ගැනීමේදී වටිනාකමින් 60% ක මුදලක් අයදුම්කරුවන්ට ලබාගැනීමට ද හැකියාව පවතී.

මෙම ණය යෝජනා ක්‍රමයට තවත් සුවිශේෂත්වයක් එක් කරමින්, ණය අයදුම්කරුවන්ට සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව වයස අවුරුදු 70 දක්වා ණය ආපසු ගෙවීමේ හැකියාව ද පවතී. එසේම, ණය අනුමත කිරීමෙන් පසුව අනුමත වාස්තු විද්‍යාත්මක නිවාස සැලසුම් 5 ක් යටතේ යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් විසින් අයදුම්කරු අදාළ රෙජිමේන්තුවේ වැඩ කණ්ඩායම්වල සහයෝගය ද ඇතිව එම නිවස ඉදිකිරීමට කටයුතු කරනු ලබයි.

ජාතියේ යහපත උදෙසා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සෑම සොල්දාදුවෙකුටම සිය ගෞරවාන්විත වෘත්තීය ජීවිතය සාර්ථකව ගත කිරීම සඳහා යුද්ධ හමුදා මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳ යුද්ධ හමුදාධිපති සමඟ සාකච්ඡා කර යුද්ධ හමුදා සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, මහජන බැංකුව සහ අනෙකුත් අදාළ අංශ සමඟ සම්බන්ධතාවයෙන් යුතුව මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන ලදී.

අවශ්‍යතා සහිත රණවිරුවෙකුට නව නිවසක්

මානුෂීය මෙහෙයුමේදී දිවිපිදූ සහ රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් යුද්ධ හමුදාධිපති ගේ අදහසකට අනුව ක්‍රියාත්මක නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය යටතේ ඉබ්බාගමුව, පාන්ගොල්ල "රණවිරු ගම" ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ තවත් නව නිවසක් පසුගිය පෙබරවාරි 13 වන දින පාදයක් අහිමි රණවිරුවෙක් වෙත ප්‍රදානය කරන ලදි. රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් හා ගජබා රෙජිමේන්තු මූලස්ථානය වෙතින් මේ සඳහා අරමුදල් සැපයිණ.

රුපියල් මිලියන 1.5 ක වටිනාකමකින් යුත් මෙම නව නිවස නිවාසලාභියා වෙත පවරාදීම ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්ගේ සුරතින් සිදුවිය.

ගැහැණු ළමුන් දෙදෙනකුගේ සහ පිරිමි දරුවකුගේ පියකු වන මෙම නිවාසලාභියා වර්ෂ 1990 දී ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට හසු වී සිය පාදය දණහිසට ඉහළින් ඉවත් කිරීමට සිදු වූ අයෙකි. රණක්ෂිතයට පත් මෙම රණවිරුවා වෛද්‍ය හේතූන් මත සිය සේවයෙන් විශ්‍රාම ලැබූ අතර, සිය නිවාස අවශ්‍යතාවය පිළිබඳ ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානය දැනුවත් වීමෙන් අනතුරුව එම රෙජිමේන්තුව වෙතින් මෙම නව නිවස ඉදිකිරීම සඳහා අවැසි ඉදිරි කටයුතු සිදුකරන ලදි.

ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එම්ඩබ්ලිව්එස් මිල්ලගල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ 7 වන (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවූ මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා 7 වන (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවේ හවපිරිස් විසින් තාක්ෂණික දැනුම සහ ඉංජිනේරු සහය ලබාදුන්හ.

ගුවන් මෙහෙයුම් පිළිබඳ ඓතිහාසික මතක සිහිපත් කෙරේ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවේ සහ විශේෂ බලකායේ සෙබළුන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් භටයින්ගේ ඓතිහාසික මතකයන් සිහිපත් කරමින් උළුවප කුඩාඹය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ දිවයිනේ ප්‍රථම ගුවන් සංක්‍රමික කෞතුකාගාරය ඉකුත් පෙබරවාරි 19 වන දින නව කමාන්ඩෝ භටයින් 157 දෙනකුගේ විසිරයාමේ පෙළපාලියට සමගාමීව විවෘත කෙරිණ.

කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ගොඅරත්න එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් නව ගුවන් සංක්‍රමික කෞතුකාගාරය විවෘත කෙරුණේ 1990 ජනවාරි මස 29 වන දින කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු පාඨමාලා ආරම්භ කිරීමෙන් පසු දැනට සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨතම පැරෂුට් නිලධාරියාද ලෙසින් වීම විශේෂත්වයකි.

මෙම කෞතුකාගාරය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ගුවන් සංක්‍රමික අභ්‍යාස සහ මෙහෙයුම් සඳහා මුල් අදියරේදී භාවිතා කරන ලද සියලුම උපකරණ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර ඇත.

ගිලන් හිත්වලට දිරි ලැබදුන් දිනක්

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී සුජීවා නෙල්සන් මහත්මිය පසුගිය පෙබරවාරි 10 වන දින මානුෂීය මෙහෙයුමේදී රණක්ෂිතයට පත් රණවීරුවන් 50 දෙනකු සුවය ලබමින් සිටින අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි "අභිමංසල - 1" හි සංචාරයක නිරත වූහ. එහිදී, රණක්ෂිතයට පත් රණවීරුවන්ගේ විවේකාගාර, ගෘහස්ථ ක්‍රීඩාගාර, පුස්තකාල හා වාටිවු නිරීක්ෂණය කළ ඔවුහු එම රණවීරුවන් වෙත සිදුකරනු ලබන ජල චිකිත්සක ප්‍රතිකාර හා ආයුර්වේද ප්‍රතිකාර ඇතුළු එම සුවතා නිකේතනයේ සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ සොයා බැලූහ.

තවද, යුද්ධ හමුදාධිපති හා සේවා වනිතා සභාපතිනිය රණක්ෂිතයට පත් රණවීරුවන් සමග සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුවදුක් පිළිබඳව ද විමසා බැලූහ. තම අත් පා පූජාකරමින් මවුබිමට යහපත් හෙට දිනක් උදාකරලීමේ උදාර අරමුණ පෙරදැරිව 2009 මැයි මාසයට ප්‍රථම පැවති මානුෂීය මෙහෙයුමේදී කටයුතු කළ රණවීරුවන් සමඟින් කැරම් සහ චෙස් ක්‍රීඩා කිරීමට ද එහිදී යුද්ධ හමුදාධිපති එක්විය. අනතුරුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් එම රණවීරුවන් ඇගයීමට ලක්කරමින් සංවිධානය කර තිබූ විශේෂ ත්‍යාග පාර්සල් බෙදාදීමේ වැඩසටහනකටද යුද්ධ හමුදාධිපති සහභාගී විය.

යුද්ධ හමුදාධිපතිගේ මගපෙන්වීමෙන් ශ්‍රීලංකා බලකායෙන් විස්කම් නිමැයුමක්

යුද්ධ හමුදාවේ "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ට සමගාමීව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ යාන්ත්‍රික හා තාක්ෂණික විශේෂඥතාවයෙන් හෙබි භටපිරිස් විසින් නිෂ්පාදනය කළ "යුනිකොබ්" (*Unicob*) නම් අති නවීන බිම්බෝම්බ ප්‍රතිරෝධක ආරක්ෂක රථය (*Mine-Resistant Ambush-Protected Vehicle*) නිදහස් දින පෙළපාලියේ ප්‍රදර්ශනය කිරීමට ප්‍රථම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත ඉකුත් පෙබරවාරි 31 වන දින ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ නිර්මාණාත්මක කුසලතාවන් තවදුරටත් ඔප්නංවාලමින් නව මුහුණුවරකින් නිෂ්පාදනය කරනු ලැබූ ඩීසල් භාවිතා කරමින් ධාවනය කරන සිලින්ඩර හයකින් සමන්විත මෙම යුනිකොබ්-එම්ආර්ඒපී (*Unicob- MRAP*) රථය යුද්ධ හමුදාවේ භාවිතයෙන් ඉවත් කරනු ලැබූ එන්ජින්, අමතර කොටස් සහ වැසි භාවිතා කරමින් නිෂ්පාදනය කර තිබීම විශේෂත්වයකි.

සැහැල්ලු සන්නද්ධ රථ කාණ්ඩය යටතේ නිෂ්පාදනය කරනු ලැබූ මෙම යුනිකොබ්-එම්ආර්ඒපී (*Unicob- MRAP*) රථය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය විසින් සිදුකරනු ලබන ක්‍රියාන්විතයන් තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇත.

මෙම රථය නිෂ්පාදනය කිරීම සඳහා අවැසි මගපෙන්වීම මෙන්ම අඛණ්ඩ දිරිගැන්වීම් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කර්නල් සේනාධිකාරක හා යුද්ධ හමුදා භටකාර්ය සම්පාදන ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී සමඟ එක්ව 61 වන සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාධිකාරක මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩීපී හතුරුසිංහ යූඑස්පී සහ සන්නාහ සන්නද්ධ බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් ලබා දුන්හ.

දේශීයව නිෂ්පාදනය කරන ලද මෙම යුනිකොබ්-එම්ආර්ඒපී (*Unicob- MRAP*) රථය තුළ සොල්දාදුවන් 9 දෙනකු සඳහා ඉඩකඩ පවතින අතර, එම රථය ආනයනික සන්නද්ධ පිරිස් ප්‍රවාහක රථ සමඟින් සසඳන විට බොහෝ විශේෂාංගවලින් සමන්විත වේ. මෙම නව රථයට 12.7 මැෂින් තුවක්කුවක්ද (*Machine Gun*), සවිකොට ඇත. තවද මාර්ගයේ මෙන්ම මාර්ගයෙන් පිටත ගමන්කළ හැකි 4 *x* 4 වර්ගයේ ධාවන පහසුකම සහිත වීම, සියලුම දිශාවන් නිරීක්ෂණය කිරීමේ හැකියාව සහිත කැමරා පද්ධතියක් තිබීම, සටන් බිමෙහි සිදුවන ක්‍රියාකාරකම් පටිගත කළ හැකි කැමරා පද්ධතිවලින් සහ *GPS* තාක්ෂණයෙන් යුක්ත වීම, දිගු දුර සන්නිවේදන හැකියාව, දේශීයව මිලදීගත හැකි අමතර කොටස් සමඟ අඩු නඩත්තු වියදම, අඩු නිෂ්පාදන පිරිවැය, වායු සමීකරණ පද්ධතිය ඇතුළු බොහෝ විශේෂාංගයන්ගෙන් සමන්විත වේ. මෙම නව රථයේ සම්පූර්ණ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 10 ක් වන අතර සන්නද්ධ රථයක් ආනයනය කිරීමට වැයවන මුදලට සාපේක්ෂව එය ඉතා අඩු පිරිවැයකි.

යුද්ධ හමුදාව වෙතින් එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල රාජකාරි සඳහා පසුගිය කාලය තුළ "යුනිබෆල්ස්" (*Unibuffels*) වැනි රථ නිෂ්පාදනය කරමින් සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබේ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ භටපිරිස් දැනට මෙවැනි රථ 65 කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කර හමුදා භටපිරිස් සමඟින් මාලි රාජ්‍යය වෙත යවා ඇති අතර එමඟින් විදේශීය හමුදා භටපිරිස් බේරාගැනීමට මෙන්ම රටට විදේශ විනිමය උපයා ගැනීමට ද බෙහෙවින් ඉවහල් වී ඇත.

'Skill to Battle' කෘතිය යුද්ධ හමුදාධිපති වෙත පිළිගන්වයි

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ අසමසම හැකියාවන් පිළිබිඹු කරමින් 2020-2021 වසර වලදී නිෂ්පාදනය කරන ලද වාහන, විදුලි උපකරණ, යාන්ත්‍රික උපකරණ සහ වෛද්‍ය උපකරණ ඇතුළු අද්විතීය නවෝත්පාදන පිළිබඳ ලේඛනගත කරන ලද *'Skill to Battle'* කෘතියේ මංගල පිටපත යුද්ධ හමුදා භටකාර්ය සම්පාදන ආඥාපති සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ කර්නල් සේනාධිකාරක මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී විසින් ඉකුත් පෙබරවාරි 21 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත පිළිගන්වනු ලැබීය.

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ වසරක ප්‍රගතිය සම්බන්ධයෙන් ලේඛනගත කරන ලද ඡායාරූප සහිත මෙම කෘතියේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව දක්වනු ලබන අසමසම සහ ආකර්ෂණීය දායකත්වය මෙන්ම එහි ප්‍රතිඵලයන් සවිස්තරාත්මකව සඳහන් කර ඇත.

චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණයට

මොරවැව, ගල්කන්ද කොටියාරාම පුරාණ රජමහා විහාරස්ථාන පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරමින් පවතින චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමේ අරමුණින් මූතූර්, පච්චනූර්, ගල්කන්ද කොටියාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය බලල්ලේ රතනසාර හිමිපාණන්ගේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් පෙබරවාරි 25 වන දින එම විහාරස්ථානය වෙත පැමිණියේය.

යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සහ 15 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හා එම විහාර සංවර්ධන සමිතිය සමග සම්බන්ධීකරණයෙන් මෙම චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේද දායකත්වය ලබාදෙනු ලබයි.

'පිච්ච වනේ මහා පුෂ්ප උද්‍යානය' ස්ථාපිත කෙරේ

අනුරාධපුර, තන්තිරිමලේ මාර්ගයේ ඇලයාලපත්තුව, මානිංගමුව ප්‍රදේශයේ පිහිටි ගම්පහ බවුත් පැලැස්ස විහාරස්ථානයට අයත් අක්කර 21 ක භූමි භාගයක් තුළ පිච්ච පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් ඉකුත් පෙබරවාරි 26 වන දින ක්‍රියාත්මක කෙරිණ. අනුරාධපුර අති පූජනීය රුවන්වැලි මහා සෑය වන්දනාමාන කිරීම සඳහා දිනපතා පැමිණෙන බැතිමතුන්ට නොකඩවා පිච්ච මල් ලබාදීමට ගම්පහ, බවුත් පැලැස්ස විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය වල්පොල ගෝතම හිමිපාණන්ගේ සංකල්පයකට අනුව ක්‍රියාවට නැංවූ මෙම "පිච්ච වනේ මහා පුෂ්ප උද්‍යානය" වැඩසටහන වෙනුවෙන් නෙත් එෆ්.එම් ගුවන් විදුලි නාලිකාව බැතිබර අනුග්‍රාහකත්වය දක්වයි.

මෙම වැඩසටහනේ, ආරම්භය සනිටුහන් කරමින් පැළ 5000 ක් රෝපණය කිරීමේ අවස්ථාවට එක් වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ආගමික වතාවත් මධ්‍යයේ පළමු පැළ කිහිපය රෝපණය කරන ලදී. මෙම අවස්ථාව සඳහා මහා සංඝරත්නය සමඟින් නෙත් එෆ්.එම් ගුවන් විදුලි නාලිකාවේ සභාපති, ගරු අමාත්‍ය එස්එම් චන්ද්‍රසේන මැතිතුමන්, උදාරුවරිගේ වත්නිල ඇත්තෝ, ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයන් මෙන්ම තවත් බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වූහ.

නෙත් එෆ්.එම් ගුවන් විදුලි නාලිකාවේ අනුග්‍රාහකත්වය මත ගජබා රෙජිමේන්තු භටපිරිස් විසින් මෙම පැළ සඳහා අවැසි තාක්ෂණික අවශ්‍යතාවයන් සහ ජල පහසුකම් ලබාදෙමින් ඒවා රැක බලාගැනීමේ කටයුතු සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා - චීන රාජ්‍යතාන්ත්‍රික සබඳතා සමරා පිරිත් සජ්ඣායනාවක්

ශ්‍රී ලංකා - චීන රාජ්‍යතාන්ත්‍රික සබඳතාවලට වසර 65 ක් සපිරීම නිමිත්තෙන් චීනයේ පිහිටා ඇති ඓතිහාසික බෞද්ධ විහාරස්ථානවල සහයෝගය මත අනුරාධපුර ඓතිහාසික අභයගිරිය විහාරස්ථානය සහ මරදාන ශ්‍රී ලංකා විද්‍යාල පරිශ්‍රයේදී පසුගිය පෙබරවාරි 26 වන දින උදෑසන සෙත් පිරිත් සජ්ඣායනාවක් පවත්වන ලදී.

එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ චීන තානාපති අතිගරු ක්වි ෂෙන්හොන්ග් H.E. Qi Zhenhong) මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, ශ්‍රී ලංකා චීන තානාපති කාර්යාලයේ නියෝජිතයින් සහ ශ්‍රී ලංකා චීන බෞද්ධ මිත්‍රත්ව සංගමයේ නියෝජිතයන් ඇතුළු තවත් බැතිමතුන් රැසක් සහභාගී වූහ.

"ආදිවාසී ජන උරුම මහා සෑය" බැති පුදට නිරාවරණය කෙරේ

දඹාන ආදිවාසී නායක විශ්ව කීර්ති වනස්පති උෑරුවරිගේ වන්නිල ඇත්තෝ විසින් නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ සහ අභිනවයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද කුරගල රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමිපාණන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුව ගුරුකුඹුර ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකරන ලද "ශාක්‍ය පුත්‍ර සීවලී මහා සෑය" හෙවත් "ආදිවාසී ජන උරුම මහා සෑය" පසුගිය පෙබරවාරි 16 වන දිනට යෙදුණු නවම් පුර පසළොස්වක පොහොය දින පැවති ආගමික උත්සවයකදී ජනසතු කරන ලදී.

පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමියන්ගේ සහ පරිත්‍යාගශීලීන් වන දිස්නා වනිගසේකර මහත්මිය සහ කොළඹ මාස්ටර් ගයිඩ් ප්‍රකාශන පුද්ගලික ආයතනයේ හිමිකරු චන්ද්‍රසේන වික්‍රමරත්න මහතාගේ ආරාධනයකට අනුව අස්ගිරි පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ඥාණරතනාභිදාන නාහිමිපාණන් සමඟින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීපී පීඑස්පී එම්ෆිල් මෙම අවස්ථාවට එක්වෙමින් චෛත්‍ය රාජයාණන් වහන්සේගේ කොත් වහන්සේ සුබ මොහොතින් නිරාවරණය කරනු ලැබූහ.

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ අතීතය සහ වර්තමානය උපුටා දක්වමින් ඔවුන්ගේ පරිණාමය පිළිබඳ දැරියක් විසින් රචනා කරන ලද කෘතියක පිටපතක් ද එහිදී නව චෛත්‍යය නිරාවරණය කිරීමේ අවස්ථාවට සමගාමීව ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ යුද්ධ හමුදාධිපති වෙත ප්‍රදානය කළාය.

වික්මැති පුතුන්ගේ අභිමානවත් දැක්ම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විශේෂිත ක්‍රියාන්විත රෙජිමේන්තුවක් වන කමාන්ඩෝ රෙජිමේන්තුවෙන් පුහුණුව ලැබූ කමාන්ඩෝ භටයින් 157 දෙනකු කමාන්ඩෝ නිල ලාංඡන සහ "මෙරුන් හිස්වැසුම්" පැළඳ විසිරයාමේ උත්සවයක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙන් පසුගිය පෙබරවාරි 19 වන දින උෑව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි.

කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාඨමාලා අංක 48-ඒ සහ 48-ඊ යටතේ පුරා මාස 18 කට අධික කාලයක් උපදේශකයින් රැසකගේ අධීක්ෂණය යටතේ ක්‍රියාන්විත උපායමාර්ග පිළිබඳ විශිෂ්ට පුහුණුවක් හැදෑරූ සුවිශේෂී වූත් අසමසම හැකියාවන්ගෙන් යුත් නිලධාරීන් 13 දෙනකු සහ සෙසුනිලයින් 144 දෙනකු එහිදී විසිර ගියහ. එම අවස්ථාව දැකබලා ගැනීම සඳහා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විසිරගිය කමාන්ඩෝ භටයින්ගේ දෙමාපියන් සහ ඥාති හිතමිත්‍රාදීන් රැසක්ද සහභාගී වූහ.

දුෂ්කරවූත්, කටුකවූත්, විශේෂිත වූ පුහුණුවක් හරහා විශිෂ්ටයන් අතර විශිෂ්ටයකු වෙමින් දේශයේත්, ජාතියේත් වගකීම් ඉටුකිරීමට "නොහැක්කක් නොමැත" යන ආදර්ශ පාඨය පෙරදැරිව කමාන්ඩෝ රෙජිමේන්තුව සමග එක්වූ අභීත පුතණුවන්ට එහිදී කමාන්ඩෝ ලාංඡන ඔවුන්ගේ දෙමාපියන්ගේ සහ ළඟම ඥාතීන්ගේ සුරතින් පැළඳ වූහ.

විශිෂ්ටයකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවට එක්වීම සංකේතවත් කරමින් ලෝකයේ විශේෂිත හමුදා සෙබළුන් පමණක් පළඳින "මෙරුන් හිස්වැසුම" මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි යුද්ධ හමුදාධිපති සමග එක්ව කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ගුණරත්න එන්ඩීසී පීඑස්සී සහ 65 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒ සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසිරගිය කමාන්ඩෝ භටයින්ට ප්‍රදානය කළහ.

ඉන් අනතුරුව, පුහුණු පාඨමාලාවේ විශිෂ්ටයන් අතරින් විශිෂ්ටයින්ට කුසලාන සහ සහතිකපත් පිරිනැමීම යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුවිය.

විසිරයාමේ පෙළපාලිය අවසානයේ රෙජිමේන්තු අධිපතිගේ ආරාධනයට අනුව, අභිනවයෙන් ඉදිකළ ගෘහස්ථ ක්‍රීඩාංගණ සංකීර්ණය සහ එම සංකීර්ණයේ පිහිටි නවීන මාදිලියේ උපකරණ සහිත ව්‍යායාම් ශාලාව විවෘත කළ යුද්ධ හමුදාධිපති යුද ජයග්‍රහණ සහ ඉතිහාසය මැනවින් සිහිපත් කරන ගුවන් සංක්‍රමික කෞතුකාගාරය ද විවෘත කළේය.

එවකට 54 වන සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති ලෙස කටයුතු කරමින් සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව අලිමංකඩ දී දිවිපිදූ මේජර් ජෙනරාල් පීපී ප්‍රනාන්දු නිලධාරිහට උපහාරයක් ලෙස මෙම ගෘහස්ථ ක්‍රීඩාංගණය දිවංගත "මේජර් ජෙනරාල් පීපී ප්‍රනාන්දු අනුස්මරණ ගෘහස්ථ ක්‍රීඩාංගණය" ලෙස නම් කරන ලදී. එසේම, "ජයසිකුරු" මෙහෙයුමේදී සිය ජීවිතය පරිත්‍යාග කළ කමාන්ඩෝ රෙජිමේන්තුවේ ප්‍රථම පරම වීර විභූෂණ (*PWV*) පදක්කම්ලාභියා වන දිවංගත මේජර් ජීඑස් ජයනාත් නිලධාරි සිහිපත් කරමින් නවීන මාදිලියේ උපකරණ සහිත ව්‍යායාම් ශාලාව ඉදිකරන ලදී. නව ගුවන් සංක්‍රමික කෞතුකාගාරය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ගුවන් සංක්‍රමික අභ්‍යාස සහ මෙහෙයුම් සඳහා මුල් අදියරේදී භාවිත කරන ලද සියලුම උපකරණ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර ඇත.

විසිරයාමේ උත්සවය අවසානයේදී, කමාන්ඩෝ සෙබළුන් ඔවුන්ගේ කමාන්ඩෝ යුධ පුහුණු හැකියාවන් මැනවින් ප්‍රදර්ශනය කරමින් විශේෂ සජීවී සංදර්ශනයක්ද ඉදිරිපත් කළහ.

"කමාන්ඩෝ භටයකු වීම පහසු කාර්යයක් නොවේ, මන්ද එයට කමාන්ඩෝ භටයින්ගේ "නොහැක්කක් නොමැත" නිර්භීත ආදර්ශ පාඨය පෙරදැරි චිත්ත ධෛර්ය සහ කැපවීම අවශ්‍ය වේ. කමාන්ඩෝ රෙජිමේන්තුවේ හිටපු රෙජිමේන්තු අධිපති ලෙසත් වන්නි මානුෂීය මෙහෙයුමේදී 58 වන සේනාංකාධිපති සහ කමාන්ඩෝ බලසේනාධිපති වශයෙනුත් මා කමාන්ඩෝ භටයින්ගේ සුවිශේෂත්වය සහ ඔවුන් සතු කැපකිරීම පිළිබඳව මනා අවබෝධයක් ලැබුවෙමි. අභියෝග මධ්‍යයේ වුවද ඔබේ දක්ෂතා තව තවත් වැඩිදියුණු කරගනිමින් මනා පුහුණුවකින් පසු ඔබ නව ගමන් මඟක් ආරම්භ කිරීමට පිවිස ඇති බව මතක තබා ගත යුතුයි."

- යුද්ධ හමුදාධිපති -

යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීමෙන් පරිසර හිතකාමී ජලජ ශාක වගා ව්‍යාපෘතියක්

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති විසින් ක්‍රියාවට නැංවූ "තුරු මිතුරු නව රටක්" සංකල්පයට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරි මංසන්දියේ සිට යුද්ධ හමුදා මූලස්ථානය දක්වා ප්‍රවිෂ්ට වන මාර්ගය දෙපස ඇවිදීමේ මංතීරු, ළමා උද්‍යාන සහ පුරන් වූ කුඹුර යළි අස්වද්දමින් ව්‍යාපෘති රැසක් දියත් කරන ලදී. ඊට තවත් උත්තේජයක් ලබාදෙමින් එම ප්‍රදේශයේ පරිසර හිතකාමී තෙත්බිම්වල අපද්‍රව්‍ය පිරිසිදු කිරීමටත්, අපද්‍රව්‍යවලින් වහනය වන ගන්ධය නැති කිරීමටත්, ජලජ ජීවීන්ට සහ ජලජ පක්ෂීන්ට යෝග්‍ය වාසස්ථාන සලසාදීමටත් හැකි පරිසර හිතකාමී ජලජ ශාක වගාවන් 200 ක් ඉකුත් පෙබරවාරි 22 වන දින ජලයට මුදාහැරිණ.

මෙම ජලජ ශාක වගා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

144 වන බලසේනාධිපති කර්නල් කේඑම්වී කොඩිතුවක්කු ගේ අධීක්ෂණය යටතේ 12 වන ගජබා රෙජිමේන්තුවේ සහ 2 වන (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවූහ. මෙම අවස්ථාවට පරිසරවේදී ඉංජිනේරු රනෝෂ් සිරිපාල මහත්මිය, පරිසර විද්‍යාඥ ඉසුරි ධර්මසෝම මහත්මිය, ඉංජිනේරු බීඩීසී කුමාර, ඉංජිනේරු සහකාර හිරන්ත ද සිල්වා, සම්පත් දහනායක (අධීක්ෂණ නිලධාරි) යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ඇතුළු යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.

ආහාරවල ගුණාත්මකභාවය යුද්ධ හමුදාධිපතිගේ ක්ෂණික නිරීක්ෂණයට

යුද්ධ හමුදා සොල්දාදුවන් වෙත උසස් තත්වයේ සහ පෝෂ්‍යදායි ආහාර ලබාදීම සහතික කරමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් පසුගිය පෙබරවාරි 12 වන දින උදැසන වැහැර ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක නිරත වෙමින් එම රෙජිමේන්තුවේ සෙසුනිල භෝජනාගාරය නිරීක්ෂණය කරන ලදී. එහිදී, ආහාර වර්ග පිළියෙල කිරීම, එම ව්‍යාංජනවල ගුණාත්මකභාවය, රස වැනි කරුණු පිළිබඳව ඔහුගේ අවධානය යොමුවිය.

එම මුළුතැන්ගෙයි පරිශ්‍රයේ ආහාර පිළියෙල කිරීම සඳහා සූදානම් කර තිබූ එළවලු, කුළුබඩු සහ අනෙකුත් අමුද්‍රව්‍යද එහිදී නිරීක්ෂණය කළ යුද්ධ හමුදාපති පිසූ ව්‍යංජන කිහිපයක ගුණාත්මකභාවය, ප්‍රමිතිය සහ රසය පිළිබඳවද සොයාබලන ලදී. ඉන් අනතුරුව, සූපවේදීන් සහ මුළුතැන්ගෙයි පරිශ්‍රයේ සේවයේ නියුතු අනෙකුත් කාර්ය මණ්ඩලය සමග අදහස් හුවමාරු කරගැනීමටද යුද්ධ හමුදාධිපති අමතක නොකළේය.

ජාතියේ යහපත වෙනුවෙන් පැය විසිහතර පුරා සේවයේ යෙදී සිටින සියලුම යුද්ධ හමුදා සොල්දාදුවන්ට හොඳම සොඛ්‍යාරක්ෂිත ක්‍රමවේද භාවිත කර පිළියෙල කරන ලද ගුණාත්මක ආහාර වේලක් ලබාදිය යුතු බවට යුද්ධ හමුදාධිපති එහිදී උපදෙස් ලබාදෙන ලදී.

සෙබළ අවශ්‍යතා යුද්ධ හමුදාධිපතිගේ ක්ෂණික නිරීක්ෂණයට

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් පෙබරවාරි 25 වන දින නැගෙනහිර ප්‍රදේශයේ සිදුකළ සංචාරයක් අතරතුර කින්නියා මාර්ග බාධකය අසල ස්ථානගත 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ "ඩී" බළගණයේද නිරීක්ෂණයකට එක්විය. එහිදී, කඳවුරේ ආහාර පිසීමේ ස්ථාන, හටනිවාස, සනීපාරක්ෂක අවශ්‍යතා සහ අනෙකුත් පහසුකම් මෙන්ම සෙබළුන්ගේ සුභසාධන කටයුතු පිළිබඳ සොයාබැලූ යුද්ධ හමුදාධිපති කඳවුරේ සිටි සෙබළු කිහිපදෙනකු සමඟද අදහස් හුවමාරු කරගත්හ.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (නැගෙනහිර) අධිපති මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 22 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, සමස්ත ආරක්ෂක සම්බන්ධීකාරක මේජර් ජෙනරාල් එල්පීකේසී විජේතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ 223 වන බලසේනාධිපති කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී යන නිලධාරීහුද සහභාගි වූහ.

රණවිරු කර්නල් ප්‍රනාන්දු ගේ දේහයට යුද්ධ හමුදාධිපති අවසන් ගෞරව දක්වයි

ඉඩම් දේපළ හා හටනිවාස අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් ඉඩම් දේපළ හා හටනිවාස ධූරයේ රාජකාරි හොබවමින් සිටියදී හදිසියේ අභාවප්‍රාප්ත වූ කර්නල් ඩබ්ලිව්ඩබ්ලිව්එල්පී ප්‍රනාන්දු අයිජී ගේ කෑගල්ල, මොලගොඩ පිහිටි නිවසට ගිය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් එතුමන්ගේ නිසල දේහයට පුෂ්පෝපහාර පුදකර අවසන් ගෞරව දැක්විය.

එහිදී, අභාවප්‍රාප්ත එම නිලධාරී ගේ භාර්යාව, දරුවන් සහ පවුලේ සාමාජිකයින් වෙත සිය බලවත් ශෝකය පළකළ යුද්ධ හමුදාධිපති එම පවුලේ සාමාජිකයන්ගේ අනාගත කටයුතු වෙනුවෙන් හැකි ඕනෑම සහයෝගයක් ලබාදීමටද පොරොන්දු විය.

උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට යුද්ධ හමුදාධිපති නිල ලාංඡන පළඳවයි

74 වන ජාතික නිදහස් දිනයට සමගාමීව මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 07 දෙනකු වෙත හා බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලද කර්නල් නිලයේ නිලධාරීන් අතුරින් 05 දෙනකු වෙත ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීවස්වී යූඑස්පී එන්ඩීසී පීවස්සී එම්පිල් විසින් නිල ලාංඡන පැළඳවිය.

ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාධ්‍යක්ෂ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් කේඒඒ උදය කුමාර ආර්එස්පී යූඑස්පී යූඑස්ඒඩබ්ලිව්සී පීඑස්සී, යුද්ධ හමුදා මූලස්ථානයේ සමස්ත ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරි ගජබා රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් එල්පීකේසී විජේතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 52 වන සේනාංකයේ සේනාංකාධිපති ශ්‍රී ලංකා පාබල හමුදාවේ මේජර් ජෙනරාල් ජීජීඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් ඩීපී හතුරුසිංහ යූඑස්පී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙන්තානන්ද යූඑස්පී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාධ්‍යක්ෂ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්ඩීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එදින උසස්වීම් ලැබූ අයවලුන් වූහ. නව මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත සංකේතාත්මකව අසිපත් පිරිනැමීමද යුද්ධ හමුදාධිපති අතින් එහිදී සිදු කෙරිණ.

යුද්ධ හමුදාධිපති විසින් නිල ලාංඡන පැළඳවූ බ්‍රිගේඩියර් නිලයට උසස්වූ නිලධාරීන් වනුයේ 542 වන බලසේනාධිපති ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බ්‍රිගේඩියර් ඩබ්ලිව්එස්වී ප්‍රනාන්දු යූඑස්පී අයිපී, ආරක්ෂක ලේකම්ගේ යුද සේවා සහායක යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ බ්‍රිගේඩියර් කේඩබ්ලිව් ජයවීර යූඑස්පී පීඑස්සී, 221 වන බලසේනාධිපති ගජබා රෙජිමේන්තුවේ බ්‍රිගේඩියර් එම්ඩබ්ලිව්ඩීඑන් මැදිවක ආර්එස්පී යූඑස්පී, යුද සේවා සහකාර ගැමුණු හේවා බලකායේ බ්‍රිගේඩියර් එන්එච් මල්සිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, 522 වන බලසේනාධිපති ගැමුණු හේවා බලකායේ බ්‍රිගේඩියර් එස්ඒ හෙට්ටිගේ ආර්එස්පී පීඑස්සී ය.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිවිපී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් පෙබරවාරි 06 වන දින කුරුණෑගල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක නිරත විය. ඔහු මාණ්ඩලික ප්‍රධානී ධූරයට පත්වීමෙන් පසු එම රෙජිමේන්තුවේ සිදුකරනු ලැබූ ප්‍රථම සංචාරය මෙය වීම විශේෂත්වයකි. එහිදී, රෙජිමේන්තු රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ රෙජිමේන්තු අධිපති වෙත එහි භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන ආචාර පුදකරනු ලැබූහ.

සිය සංචාරය තුළ එහි භටපිරිස් ඇමතීමටද අමතක නොකළ හෙතෙම ඉදිරියේදීත් රෙජිමේන්තුවේ අභිවෘද්ධිය උදෙසා හැකි උපරිමයෙන් කටයුතු කරන බවද සඳහන් කළේය. මෙම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාධිධායක කර්නල් එන්යූජේඑස් ගුණවර්ධන ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.

මූලික බතික් පුහුණු පාඨමාලාවක් නුදුරේදීම

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ අදහසකට අනුව ක්‍රියාත්මක රාජකාරියේදී මියගිය/අතුරුදහන්/ආබාධිත සහ සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ හා යුද්ධ හමුදාවේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ පවුල්වල ආර්ථිකය නගාසිටුවීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ බතික් ආයතනයක් සමග එක්ව මූලික බතික් පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීමට නියමිතය. ගෙවීමකින් තොරව නුදුරේදී ආරම්භ කිරීමට නියමිත මෙම පුහුණු පාඨමාලාවට අදාළ ලිපිලේඛන එම ආයතනයේ නිර්මාණ අධ්‍යක්ෂිකා/ප්‍රධාන විධායක නිලධාරිනි දර්ශි කීර්තිසේන මහත්මිය විසින් යුද හමුදා සේවා වනිතා සභාපතිනිය වෙත භාරදීම 2022 පෙබරවාරි මස 15 දින යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි සේවා වනිතා කාර්යාලයේදී සිදුකරනු ලැබුවාය.

මෙහිදී, පාඨමාලාවේ විෂයගත කරුණු පිළිබඳ මෙන්ම රණවිරුවන්ගේ ආර්ථිකය නගාසිටුවීමට මූලික බතික් පුහුණු පාඨමාලාවේ දායකත්වය පිළිබඳ සාකච්ඡා කරන ලදී. එමෙන්ම, පාඨමාලාව නිමාවෙන් පසු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පවුල්වල සාමාජිකයන්ට බතික් කර්මාන්තය ස්වයං රැකියාවක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාවද පැහැදිලි කරදෙන ලදී. තවද, මෙම අවස්ථාවට සමගාමීව කැලුම් ආනන්දගොඩ මහත්මිය විසින් ආර්ථික අපහසුතා ඇති සේවයේ නියුතු රණවිරුවකුගේ දරුවකු වෙනුවෙන් 2020 වසරේ සිට උසස් අධ්‍යාපනය තෙක් වාර්ෂිකව ලබාදෙනු ලබන ශිෂ්‍යත්ව පරිත්‍යාගය මෙම වසරේදීත් ලබාදීම සිදුකරන ලදී. සේවා වනිතා සභාපතිනිය සමග බුද්ධි බතික් ආයතනයේ නිර්මාණ අධ්‍යක්ෂිකා ඇතුළු නියෝජිතයින් අදාළ පාඨමාලාව පැවැත්වීම සඳහා අවැසි ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත මැනිංවුන් විවාහක නිවාස සංකීර්ණයේ පිහිටි භූමියෙහි නිරීක්ෂණ චාරිකාවකද නිරත වූහ.

මැනිංටවුන් හි ඉදිකිරීම් නිරීක්ෂණයක

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ගේ අදහසකට අනුව නාරාහේන්පිට මැනිංටවුන් යුද්ධ හමුදා විවාහක නිවාස පරිශ්‍රයේ ඇති වෙළඳ සැල් ගොඩනැගිල්ල සඳහා අලුතින් කොටසක් එකතු කිරීමේ කටයුතු මේ දිනවල සිදුකරමින් පවතී. ඒ අනුව දැනට එහි ඇති බේකරිය, ආපන ශාලාව, පිරිමි/කාන්තා රූපලාවණ්‍යාගාරය හා පිරිමි/කාන්තා මැහුම්හල නවීන පහසුකම්වලින් සමන්විතව වැඩිදියුණු කිරීමට නියමිතය. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය පසුගිය ජනවාරි 31 වන දින පෙරවරුවේ එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අතර, එහිදී ඉදිකිරීම් රාජකාරියේ නිරත ඉංජිනේරු සේවා භටපිරිස්වලට උපදෙස් ලබාදෙමින් ඔවුන් හා සුභදව අදහස් හුවමාරු කරගැනීමටද කටයුතු කළාය.

නිදහස් දින පෙරහුරු සාමාජිකයින්ට සංග්‍රහයක්

නිදහස් සැමරුම් උළෙලේ පෙර පුහුණුවීම්වල නිරත භටපිරිස් සඳහා *Sunquick Snack Pack* ලබාදීමට *Sunquick Lanka (Pvt) Ltd* ආයතනය කටයුතු කරන ලදී. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ගේ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ගේ පූර්ණ සම්බන්ධතාවයෙන් හා මඟපෙන්වීමෙන් භටපිරිස්වලට පුහුණුවීම් අතරතුර පානය කිරීම සඳහා එහිදී *Sunquick Snack Pack 150,000* ක ප්‍රමාණයක් පිරිනැමිණ.

සෙ/317077 කෝප්‍රල් අබේසිංහ
ඒඑම්එම්පී පිඩබ්ලිව්පී
ශ්‍රී ලංකා පාබල හමුදාව

තුනුක්කායි ඉදිරි ආරක්ෂක වළල්ලට පණදුන් අභීත විරුවා

ඌව වෙල්ලස්ස මහ කැරැල්ලේදී ජාතිය බේරාගැනීමේ සටනට උරදුන් වීරවරුන්ගේ පරපුරෙන් වටිනා පුත්‍රයෙකු ජාතියේ පිනට පහළ විය. එය අපට තවත් කැප්පෙට්පොල වීරුවකුගේ පුනරුත්පත්තියකි.

ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අඹගහපිටිය සුන්දර ගම්මානයකි. ගොවි රජකු වන ඒ.එම්. බාලඅප්පුහාමි පියාණන් හා ආර්.එම්. පුංචිනෝනා මෑණියන් මේ දරු උපත පින් කෙතක් වේවායි ගමේ පන්සලට ගොස් තුණුරුවන්ගේ ආශිර්වාදය පැතූහ. වර්ෂ 1982 ක් වූ ජනවාරි මස 30 වන දින ඔවුන් දෙපළගේ තුරුලට කිරිකැටියෙක් උපන්නේය. ඒ කුමරුවා හට අබේසිංහ මුදියන්සේලාගේ මධුශංඛ ප්‍රියනාත් අබේසිංහ යන නම තැබිණ.

මධුශංඛට එක් අක්කා කෙනෙකි. ඇය අනෝමාය. අසංක හා දුමින්ද ඔහුගේ අයියලා දෙදෙනාය. මධුශංඛ ගේ පවුලේ බාලයා එරංග මල්ලීය. බහතෝරන වියට පැමිණි පුංචි මධුශංඛ පුතුට අකුරු කරන්නට ගමට නුදුරු පාසලක් ලැබිණි. එය මොනරාගල අධ්‍යාපන කොට්ඨාසයේ පුංචි දූ පුතුන්ගේ නැණස පෑදූ බුද්ධම මහ විද්‍යාලයයි. යන්තම් අවුරුදු 07 ක් වූ මධුශංඛට පිය සෙනෙහස අහිමි වී ගියේ ද, අම්මා සමග දරුවන් පස් දෙනකු කිසිදු හව්හරණක් නොමැතිව තනි වූයේ ද, රුදුරු මිනිසුන්ගේ අමානුෂික ක්‍රියාවන් හේතුවෙනි. වර්ෂ 1988 ක් වූ සැප්තැම්බර් මස 08 වන දින රාජ්‍ය විරෝධී කොල්ලකරුවන්ගේ සාහසික ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන්, පුංචි කැදැල්ලක උතුරාගිය සතුටට කණකොකා හැඬූ අතර, පිතෘ මූලිකව තිබූ පවුලේ බර කරට ගැනීමට අසරණ මවට සිදුවිය. කෙමෙන් කෙමෙන් අගහිඟකම් නිවස තුළට රිංගද්දී, අධිෂ්ඨානයෙන් ඔපවත් වූ මධුශංඛගේ මව බාල සොහොයුරන්ගේ වගකීම අනෝමාව පවරා රැකියාවක් සොයා



කුඩාකල මධුශංඛ තම පියා සමග

වැටකඩුල්ලෙන් එපිටට පය එසවූවාය. සියඹලාණ්ඩුව රජයේ රෝහලෙහි උපස්ථායිකා තනතුරක් ලද මධුශංඛගේ මව තම දරුවන් පස්දෙනා පෝෂණය කළේ එම රැකියාවෙන් ලද සොච්චම් මුදලෙනි.

බුද්ධම රජ මහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය පානමයාගේ රතනසාර හාමුදුරුවෝ සෙවණේ දහම් අධ්‍යාපනය ලබමින් ඉරු දින දහම් පාසලේ ද, ඉතා කැපී පෙනෙන චරිතයක් බවට පත් වූ ඔහු කධීන පෙරහැරේ, වෙසක් පිංකමේ, පෝයදා මල් පිංකමේ ලස්සන බබළවන්නට වෙහෙසී වැඩකළ පුතකු විය. යන්තම් අත පය දරදඬු වී හිරිමල් තරුණ ඉලන්දාරියකු බවට පත්වෙමින් සිටි මධුශංඛ හට අම්මා තනිවම පවුල වෙනුවෙන් විඳින දුක් කම්කටොලු දෙස බලා සිටීමට නොහැකි වූයෙන්, පාසල් යන අතරතුරදී පවා යම් යම් රැකියා කිරීමට පෙළඹුණේ පවුලේ ආර්ථික තත්වය යහපත් කිරීමේ සුපසන් වූ හැඟීමෙනි.

විටෙක ගමේ කුඹුරේ උදැල්ල අතැතිව සිටි මධුශංඛ විටෙක බදාම හැන්ද හා සවල අතැතිව වැඩබිමක සිටිනු දක්නට ලැබුණේ ඔහුද පවුලේ බර කරට ගත් දිරිය දරුවකු හෙයිනි. අකමැත්තෙන් වුවද 10 වසරේදී අසිරිමත් පාසල් ජීවිතයට අවසන් නිත තැබූ මධුශංඛ පවුලේ ආර්ථික බර අඩුකිරීමේ නිත්‍ය සාමාජිකයකු බවට පත්විය. ගම් ප්‍රදේශයේ විවිධ රැකියාවල නිරත වුවත්, මධුශංඛගේ සිත නිතැතින්ම ඇදීගියේ රටට අභාග්‍යයක් වූ රුදුරු ත්‍රස්තවාදයට එරෙහිව අවි එසවීමේ උදාරතර සිතුවිල්ලටයි. රටම කුරිරු ත්‍රස්තවාදී බියෙන් ඇලළී ගිය මොහොතක, ගමට රටට වැඩදායී මිනිසකු වීමේ උදාරතර සිතුවිල්ල ඇතිව, දහසක් බලාපොරොත්තු පෙරදැරිකොටගෙන තම මවගේ සහ සහෝදර සහෝදරියන්ගේ ආශිර්වාදය ලබා ජීවිතයේ යෝධ පිම්මක් වෙත පියනැගූ ඔහු වර්ෂ 2002 ක් වූ දෙසැම්බර් මස 07 වන දින වැටකඩුල්ලෙන් එළියට පියමැන පන්සල වෙත ගොස් "අපේ හාමුදුරුවනේ මම හමුදාවට බැඳෙන්න යනවා. ඔබ වහන්සේට කියන්නයි ආවේ" යයි පවසන්නට විය. එවිට උන්වහන්සේ විසින් "දරුවෝ හොඳ තීරණයක් අරන් තියෙන්නේ රට බේරා ගනිල්ලා" යනුවෙන් පවසා පිරිත් නූලක් ද මධුශංඛ ගේ දකුණතේ ගැටගසා ආශිර්වාද කළහ.

ජාතිකාභිමානයෙන් ඔදවැඩී සිටි මධුශංඛ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවට ආධුනික සෙබළෙක් ලෙස එක් වූ අතර, ආධුනික පාඨමාලාව හැදෑරීම සඳහා යොමු කෙරුනේ අම්පාර කොණ්ඩුවටුවාන යුද්ධ හමුදා සටන් පුහුණු පාසල වෙතය. එහිදී ද පුංචි කාලයේ සිට ඇඟපතෙහි තිබූ මහා ජවයට, අධිෂ්ඨානශීලීභාවය, හික්මීම පෙරදැරිකොටගෙන පැවති නිහතමානීත්වයත් නිසා පුහුණු පාසලේ නිලධාරීන්ගේ සහ උපදේශකවරුන්ගේ පැසසුමට ලක්වෙමින් ආධුනික පුහුණු පාඨමාලා අංක 38 සාර්ථකව හැදෑරීය.

ආධුනික පාඨමාලාව සාර්ථකව හදාරා විසිර යාමෙන් අනතුරුව ආධුනික සෙබළකු ලෙස මධුශංඛ ඇතුළුවන්නේ ශ්‍රී ලංකාවේ පැරණිතම රෙජිමේන්තුව වූ ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතයි. ඉන් අනතුරුව 8 වන බළඇණිය ශ්‍රී ලංකා

මධුශංඛ තම මව සහ සහෝදර සහෝදරියන් සමග

පාබල හමුදාවට ඇතුළත්ව එතැන් පටන් තමාට පැවරෙන කාර්යයන් මනාව ඉටුකරමින් බළඇණියේ සියලු දෙනා අතර ජනප්‍රිය වූ සාමාන්‍ය සෙබළ මධුශංඛ ප්‍රියනාත් අබේසිංහ තම ඒකකයට මෙන්ම කණ්ඩායමට මාහැඟි සේවයක් සැපයූවේය. ඔහුගේ බණ්ඩයේදී ඔහු දැක්වූ විශේෂ කුලසතා, ක්‍රීඩා දක්ෂතා ඔහුගේ කණ්ඩායම තුළ පමණක් නොව අනෙකුත් කණ්ඩායම් සමඟද කරට කර සිට ජය ලබන්නට තරම් ප්‍රබල විය. මධුශංඛ යුද්ධ හමුදාවේ තම සේවා කාලයට සරිලන දැනුම හා පරිණතභාවය කෙමෙන් ලබමින් සිටි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 2005 ක් වූ දෙසැම්බර් මස 31 වන දින යාපනය අර්ධද්වීපයේ අච්චුවේලි යුද්ධ හමුදා කඳවුරේදී ලාන්ස් කෝප්‍රල් නිලයට උසස්වීම් ලැබුවේ ඔහුගේ සිතෙහි වූ දහසක් බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ඇතුළත්ව වීර සෙබළකු ලෙස කළ මෙහෙය ඇගයීමට, ලාන්ස් කෝප්‍රල් අබේසිංහ වෙත පිරිනැමූ පදක්කම් රැසකි. එක දිගට නැගෙන වෙඩි හඬ සමඟ උතුරු නැගෙනහිර යුද්ධමේ සතුරන් අතර රැඳෙමින් කළ අගනා මෙහෙවර වෙනුවෙන් පූර්ණභූමි පදක්කමත්, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කමත් හිමිකරගත් මොහු නැගෙනහිර හා උතුරු මානුෂීය මෙහෙයුම්වලට සක්‍රියව දායක වෙමින් නැගෙනහිර හා උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම්වලටද හිමිකම්පෑ වීරෝදාර රණවිරුවකු බවට පත්විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණුව හදාරා සිටි ලාන්ස් කෝප්‍රල් අබේසිංහ එම පුහුණුව තුළින් ලබාගත් පන්තරයෙන් යුද පිටියේදී සුවිශේෂී දක්ෂතාවන් දක්වන්නට සමත් වූයේ සමකාලීන තම සහෝදර සෙබළුන්ට ද මහත් වූ ආදර්ශයක් ලබාදෙමිනි. එම දක්ෂතා නිසාම 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඒ කණ්ඩායමට අයත් විශේෂ පාබල ක්‍රියාන්විත බණ්ඩය නියෝජනය කිරීමේ මහඟු අවස්ථාව උදාකරගත් මොහු ශ්‍රී ලංකාද්වීපය ත්‍රස්තවාදීන්ගෙන් මුදවාගැනීම සඳහා තම දහදිය මහන්සිය හා යුද නිපුණත්වයත් දක්ෂතාවයත් ලබාදෙන ලද්දේ උපතින්ම ගෙන ආ වීර ජාතිමාමකත්වය පෙරටු කරගෙනය. මාවිල්ආරු සොරොව්ව බේරාගැනීමෙන් ඇරඹී මානුෂීය මෙහෙයුම වෙනුවෙන් සක්‍රියව දායක වූ මේ විරුවාණන්, 8 වන පාබල බළඇණිය විසින් අත්පත් කරගත් ජයග්‍රහණයන් වෙනුවෙන් ඉදිරියෙන්ම සිටි විශිෂ්ට වීර සොල්දාදුවකු විය.

හමුදා සේවයේ නියුතු මධුශංඛ (වම්පස)

කට්ටපරිච්චාන් තෝප්පූර් නගරය මුදවා ගැනීම, පෙරියතම්පනය ප්‍රදේශය මුදාගැනීම, ත්‍රස්තවාදීන් විසින් වියරිනාම් බේස් ලෙස හැඳින්වූ කඳවුර අත්පත් කරගැනීම, පාලම්පිඩිඩි නගරය අත්පත් කරගැනීම, විලාතිකුලම් කඳවුර අත්පත් කරගැනීම හා තුණුක්කායි ප්‍රදේශය අත්පත් කරගැනීමේදී මධුශංඛ ප්‍රියනාත් අබේසිංහ රණවිරුවා දක්වූ රණකාමීත්වය, දැනුදු 8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා සෙබළුන් විසින් අනුස්මරණය කරන්නේ නැගෙන කඳුලක් දැස තුළ සඟවාගෙන මහත් වූ අභිමානයෙනි.

වර්ෂ 2008 ක් වූ ජූලි මස 25 වන දින ලාන්ස් කෝප්‍රල් අබේසිංහ රණවිරුවාද උදෑසනින්ම පිබිදුණේ තම බණ්ඩයට භාරදී තිබූ භාරදූර රාජකාරිය නොපිරිහෙලා ඉටුකිරීමේ අභිලාෂය පෙරදැරි කොට ගෙනය. බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල මරමස්ථානයක් වූ තුණුක්කායි ප්‍රදේශය මුදාගැනීම ලෙහෙසි පහසු කාර්යයක් නොවීය. අසීරු අභියෝගය ජයගැනීමේ හසල හැකියාවකින් හෙබි හා යුද්ධමේ විශේෂ ජයග්‍රහණයන් ලබා සිටි 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට එම තීරණාත්මක අභියෝගය ජයගැනීමේ හමුදා නියෝගය නිකුත්වූයේ ඒකකයේ සියලු දෙනාගේ සිත්තුළ තවත් වීර වික්‍රමාන්විතයක සටහන් ජනිත කරවමිනි.

තුණුක්කායි ප්‍රදේශය බේරාගැනීමේ බිහිසුනු සටන ඇරඹිනි. උදෑසන උදාවෙයි, දහවල ලබයි, රැය ළඟාවෙයි, සතර අතින් ඇසෙන එකම හඬ, වෙඩි හඬයි. ඉදිරියෙන් පෙනෙන්නේ බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ය. සහෝදර සෙබළුන් එකා දෙන්නා ඇද වැටෙයි. එහෙත් මේ සියල්ලටම මුහුණදීමට හැකි නිර්භීතභාවය හා අධිෂ්ඨානශීලීත්වය පෙරදැරි කොටගෙන මධුශංඛ සටන් වදින්නට විය. ලාන්ස් කෝප්‍රල් අබේසිංහ සමඟ සිටි විශේෂ පාබල ක්‍රියාන්විත බණ්ඩයෙහි ප්‍රධාන ඉලක්කය වූයේ තුණුක්කායි ප්‍රදේශයේ ඉදිරි ආරක්ෂක වළල්ලට මීටර් 400 පමණ ඉදිරියෙන් පිහිටි ත්‍රස්තවාදීන්ගේ ආරක්ෂක වළල්ලට

"වැඩිදුර ඉගෙන ගන්න අබේසිංහ පුතාට ඕන වුනේ නෑ. ඉස්කෝලේ ගමන නැවැත්තුවේ ආමි එකට යන්නමයි. ඒ කාලේ යුද්ධය හරිම දරුණුයි. යුද්දෙට ගිහින් මගේ පුතා නැතිවුනාට එයාගේ වීරකම් ගැන හමුදාවෙ මහත්තුරු කියනකොට මට හරිම ආඩම්බරයක් දැනෙනවා"

- මව -

පහරදී විනාශ කිරීමයි. ත්‍රස්තවාදීන් විසින් තම භූමියේ ආරක්ෂාව තරකර ගැනීම සඳහා ළඟා විය හැකි සියලු මාර්ග අවහිර කරමින් මීටර් 1500 ක් පමණ පළල විවෘත භූමියක් ඉදිරියේ විශාල පස් බැම්මක් සමගින් යුද අගල් සහ ශක්තිමත් ආවරණ සහිත බංකර් පෙළක් ඉදිකර තිබුණි. කුඩා කණ්ඩායම් වශයෙන් ආරක්ෂක වළල්ලෙන් ඉදිරියට ගිය මධුශංඛ ඇතුළු පිරිස විවෘත භූමියේ බහුලව තිබූ සතුරු ක්‍රියාකාරකම් ද නොතකා සූක්ෂමව ඔවුන්ගේ බංකර් වෙත ළඟා වූහ. ත්‍රස්තවාදීන් විසින් පස්බැම්මේ සිට සැඟවී එල්ල කරන ලද ප්‍රහාර සහ ඔවුන්ගේ සැඟවුණු වෙඩිකරුවන්ගෙන් එල්ල වූ ප්‍රහාරවලින් නොනැවතුණ ජාතියේ වීරුවන් කැල සතුරු බංකර් පෙළ වෙත ළඟාවී ත්‍රස්තවාදීන් හට විස්මයජනක ප්‍රහාරයක් එල්ල කළේ සතුරාට ඇසිපිය හෙළීමටවත් අවස්ථාවක් ලබා නොදෙමිනි. සතුරන් විමතියෙන් විමතියට පත්කරවමින් ඔවුන්ගේ හිස මතට පතිත කරවූ වෙඩි වර්ෂාව හේතුවෙන් භීතියට පත් ත්‍රස්ත කැළ හිස් යූ යූ අත දිවයද්දී ත්‍රස්තවාදීන්ගේ බංකර් 07 ක් මුළුමනින්ම විනාශ වී තිබුණි.

පසුපසින් පැමිණි හටපිරිස්වලට ඉදිරියට ගමන් කිරීම සඳහා ඉඩප්‍රස්ථාව ලබාදී තව තවත් ඉදිරියට ඇදෙමින් ත්‍රස්තවාදීන් හට දැවැන්ත ප්‍රහාර එල්ල කර රණබිමේ අතිශූර දස්කම් පෑ ලාන්ස් කෝප්‍රල් අබේසිංහ ඇතුළු වීරු කැල හට දැකගැනීමට හැකිවූයේ, භූමියේ ඉදිරියේ රහසිගත ලෙස ඉදිකර තිබූ තවත් බංකර් පෙළකි. සිය ජීවිත අවදානම ගැනද නොතකා ඔහු තමා සතු ආර්පීජී අවිය හොඳින් හසුරුවමින් සතුරු බංකර් පෙළ වෙත දැවැන්ත ප්‍රහාරයක් එල්ලකර ඉදිරියටම ඇදෙන්නට විය. යුහුසුලුව හා කඩිසරව තම රණකාමීත්වය විදහාපාමින්, සතුරා වෙත දිගින් දිගටම ප්‍රහාර දියත් කරමින් රණබිමේ තම අණසක පතුරවන්නට වූ ලාන්ස් කෝප්‍රල් අබේසිංහ ත්‍රස්තවාදීන්ට මහත් හිසරදයක් වූයෙන්, ඔහු ඉලක්ක කර දැඩි ප්‍රහාරයක් එල්ලකර මෙම අහිත රණවීරුවා අඩපණ කිරීමට උත්සහ දැරිය. දෛවය නැවත වරක් ලාන්ස් කෝප්‍රල් අබේසිංහ රණවීරුවාට ද සරදම් කරද්දී එම ප්‍රහාරයෙන් ඔහුට දරුණු ලෙස තුවාල සිදුවිය. තුවාල ලබා තම රුධිරය ලංකා මාතාවගේ තුරුලට ගලා ගියද එම කැපකිරීමෙන් අඩපණ නොවූ ඔහු වීරත්වයෙන් ඔදවැඩි ජාතිකාභිමානයෙන් නැගී සිට තම අත රැඳි අත් බෝම්බය සමග සතුරු බංකරයක් වෙත බඩගා ගියේ එම බංකරයෙන් තම සහෝදර සෙබළුන්ට එල්ල වී තිබූ තර්ජනය හොඳාකාරවම දුටු නිසාය. ජෙෂ්ඨ රණවීරුවකු වශයෙන් මියයාම යෙහෙකැයි සිතූ නිසාදෝ, තම අත වූ අත්බෝම්බය ආරක්ෂිත ඇණය මුදා හරිමින් එක් වරම බංකරය තුළට කඩා පැන බෝම්බය පුපුරවා හැරියේය. සතුරු බංකරය තුළ වූ පුපුරණ ද්‍රව්‍ය පුපුරා යාම හේතුවෙන් ඒ තුළ සිටි ත්‍රස්තවාදීන්ගේ සහ අහිත රණවීරුවකු වූ ලාන්ස් කෝප්‍රල් අබේසිංහගේ මෘතදේහයන් සොයා ගැනීමට නොහැකි වූයේය. ඔහු මිය ගියේ ජාතික වීරයකු වශයෙන් තවත් ත්‍රස්තවාදීන් විශාල පිරිසක්ද විනාශයට පත්කර තම සහෝදර සෙබළුන්ද බේරා ගනිමිනි. මෙම අහිත රණවීරුවාගේ අවසන් හුස්ම පොඳ වාතයට මුසුවන විට මව්බිමට වීර පුත්‍රයකුගේ අහිමිවීම දෙරණ කම්පා කරවන්නක් විය.

උතුරු මානුෂිය මෙහෙයුමේ දී ශ්‍රී ලංකාද්වීපය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් බේරාගැනීම සඳහා තම ජීවිතය ගැනද නොතකා සිය සහෝදර සෙබළුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම පිණිස ත්‍රස්තවාදීන් සිටි බංකරයක් තුළට පැන බෝම්බය පුපුරවා ත්‍රස්තවාදීන් විනාශකර දැමීමේ වීර වික්‍රමාන්විතය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූද, සන්නද්ධ සේවාවන්හි සේනාවිධායක වූද, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් වර්ෂ 2012 ක් වූ මැයි මස 19 වන දින ගාලු මුවදොර පැවති තෙවන විජයග්‍රාහී පෙළපාලියේ දී මධුශංඛ ප්‍රියනාත් අබේසිංහගේ නාමය වෙනුවෙන් ඔහුගේ මැණියන් වෙත "පරම වීර විභූෂණය" පිරිනමන ලදී.

මේ වන විට මධුශංඛ ප්‍රියනාත් අබේසිංහ රණවීරුවාගේ මව වන ආර්.එම්. පුංචිනෝනා මහත්මිය වර්ෂ 2012 වූ මැයි මස 15 වන දින සිට රෝහලේ සේවයෙන් විශ්‍රාම ගෙන නිවසට වී අනෙකුත් දරු මුණුබුරන් සමගින් කාලය ගත කරන්නීය. ඔහුගේ වැඩිමල් සොහොයුරිය වන ඒ.එම්. අනෝමා ප්‍රියදර්ශනී විවාහක දෙදරු මවකි. ඒ.එම්. අසංක ප්‍රියංකර හිඳරු පියෙකි. ඒ.එම්. දුමින්ද සුදර්ශන ද දෙදරු පියෙකි. බාලසොයුරා වන ඒ.එම්. එරංග නිරෝෂන තම සෙහොයුරු මධුශංඛ ගේ අඩි පාරේ යමින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ බලනැව් තනතුර හොබවනු ලබන අතර, ඔහු ද මේ වන විට එක්දරු පියෙකි. ශ්‍රී ලංකාද්වීපය රුදුරු ත්‍රස්තවාදයෙන් මුදවාගෙන මතු පරපුරට නිදහස්, නිවහල් දේශයක් උරුමකර දීම පිණිස සිය පුතු අහිතව සතුරා සමග යුද වැදුණු බැව් සිහියට නැගෙන කල මෙවන් දරුවකු හට මවකවීම තමා ලද භාග්‍යයක් බව ආර්.එම්. පුංචිනෝනා මහත්මිය පවසයි.

යුද්ධ හමුදා මූලස්ථානය විසින් ප්‍රකාශිත "උත්තමාචාර්ය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.

ගුවන අරා දෙරණ සිසාරා විස්කම්පාන යුද්ධ හමුදා පැරෂුට් භටයෝ

ලුතිනන් දිලංක ගුණතිලක, ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

යුද්ධයේදී සතුරු භූමිය වෙත ළඟා වී සතුරාගේ ඉලක්ක විනාශ කරමින් සතුරාට අභියෝග කිරීමත්, සතුරා පුදුම කරවන අන්දමේ ප්‍රහාර එල්ල කිරීම මඟින් සතුරාට දැවැන්ත හානියක් අත්කරදීමත් සඳහා විවිධ උපක්‍රම භාවිත කෙරේ. එලෙස සතුරු භූමියේ සංග්‍රාමික ක්‍රියාන්විත සිදුකිරීමට උපක්‍රමිකව යොදාගන්නා සුවිශේෂී හමුදා කණ්ඩායමක් ලෙස සංග්‍රාමික පැරෂුට් භටයින් හැඳින්විය හැක.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් 3 ක් හා සෙසුනිලයන් 24 දෙනකු ඉන්දියාවේ අග්‍රා පැරෂුට් පුහුණු පාසලෙන් පුහුණුව ලබා පැරෂුට් භටයන් ලෙස 1979 වර්ෂයේ දෙසැම්බර් 29 වන දින විසිරයාමත් සමග ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ ආරම්භය සනිටුහන් විය. ශ්‍රී ලංකා පැරෂුට් හි නිර්මාතෘවරුන් වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ පියා ලෙස හඳුන්වන මේජර් එස්ඩී පීරිස් ශ්‍රී ලංකාවේ ප්‍රථම පැරෂුට් භටයා ලෙස ඉතිහාසයට එක්විය.

මෙලෙස ඉන්දියාවේ පුහුණුව ලද පැරෂුට් භටයින් ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම පැරෂුට් සංදර්ශනය ඉන්දියානු පැරෂුට් උපදේශකයින්ගේ සහය ඇතිව 1980 වර්ෂයේ ඔක්තෝබර් 10 වන දින කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය (වර්තමානයේ ජෙනරාල් සර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය) විවෘත කිරීමේ උත්සවයේදී පවත්වන ලදි.

ඉන් අනතුරුව කමාන්ඩෝ පැරෂුට් භටයින්ට ඉන්දියාවේ පැරෂුට් පුනරීක්ෂණ පුහුණුවීම්ද පකිස්ථානය වෙතින් පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ පාඨමාලාව හා ජම්ප් මාස්ටර් පාඨමාලාව ලබාදී පැරෂුට් ක්‍රියාන්විත ආශ්‍රිත හැකියාවන් වැඩි දියුණු කරන ලදි.

ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් විවර කරමින් මේජර් එන්ජී චන්ද්‍රසේන ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස්ආර පැරෂුට් භටයා ලෙස පත් විය. ඔහු නිදහස්ආර පැරෂුට් පාඨමාලාව ඇමෙරිකාවේදී සාර්ථකව හදාරා ශ්‍රී ලංකාවට පැමිණි පසු කමාන්ඩෝ පැරෂුට් භටයින් නිදහස්ආර පැරෂුට් පැනීම් සඳහා අවශ්‍ය භූමි පුහුණුවීම් ආරම්භ කරන ලදි.

පසුව කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිලධාරියෙකු සහ සෙසුනිලයින් 04 දෙනකුට ඉන්දියාවේදී ප්‍රථම නිදහස්ආර පැරෂුට් පාඨමාලාව හැදෑරීමට අවස්ථාවක් හිමි වූ අතර, කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිලධාරියකු සහ

"වෘත්තීයමය හමුදාවක යුද ශක්තිය ඉහළ නංවමින් මෙරට සහ විදේශයන්හි දී මවුබිමේ නාමය සෑම විටම ඉහළින් ඔසවා තබන්නට කටයුතු කරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංග්‍රාමික පැරෂුට් කණ්ඩායම අප රට සතු සුවිශේෂී වත්කමකි. ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම රටට අත්කර දෙන්නේ ඉමහත් කීර්තියකි"

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨතම පැරෂුට් භටයා වේ.

තවත් සෙසුනිලයකුට ඉන්දියාවේදී ප්‍රථම පාත්‍රයින්ඩර් පාඨමාලාවද හැදෑරීමට අවස්ථාවක් ලැබීමත් සමග කමාන්ඩෝ සෙබළුන්ගේ පැරෂුට් ක්‍රියාන්විත හැකියාවන් වර්ධනය විය.

ඒ අනුව, කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය ගනේමුල්ල කඳවුරේ ස්ථාපනය කළ අතර, 1990 ජනවාරි 29 වන දින 01 වන පැරෂුට් පුහුණු පාඨමාලාව තෝරාගත් කමාන්ඩෝ භට කණ්ඩායමක් සඳහා කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය වෙතින් පවත්වන ලදි.

පැරෂුට් පුහුණු අංශයේ පුහුණුවීම් සඳහා අත්‍යාවශ්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කරමින් ගනේමුල්ල පැරෂුට් පුහුණු අංශය තුළ පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකළ අතර, එම ගොඩනැගිල්ල 1991 මාර්තු 15 වන දින එවකට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් හැමිල්ටන් වනසිංහ විසින් විවෘත කරන ලදි. එම වසරේදීම ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට නිදහස් ආර පුනරීක්ෂණ පැරෂුට් පැනීම් පකිස්ථාන උපදේශකයින්ගේ සහාය ඇතිව රත්මලාන ගුවන් පථයේදී සාර්ථකව සිදුකරන ලදි.

පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් තවදුරටත් පුළුල් කරමින් කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය විශේෂ බලකායේ නිලධාරීන්ට හා සෙසු නිලයන්ට මූලික පැරෂුට් පාඨමාලා අංක 02 හැදෑරීමට අවස්ථාව ලබාදෙන ලදි. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතද එම පාඨමාලාව හැදෑරීම සඳහා එක් ඇබෑර්තුවක් වෙන් කරදුන් අතර, එම පාඨමාලාව සාර්ථකව හදාරන ලද බලසෙණ නායක බී.එන් රත්නකුමාර ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රථම පැරෂුට් භටයා ලෙස ඉතිහාසයට එක් විය.

ශ්‍රී ලංකා යුද හමුදා නිදහස් ආර පැරෂුට් භටයින් විසින් 44 වන නිදහස් උත්සවය වර්ණවත් කරමින් නිදහස් ආර පැරෂුට් සංදර්ශනයක් පැවැත් වූ අතර, මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ නිදහස් ආර ප්‍රථම පැරෂුට් සංදර්ශනය ලෙස ඉතිහාසයට එක්විය. කමාන්ඩෝ රෙජිමේන්තුවේ මේජර් එස් සූරියබංඩාරගේ මූලිකත්වයෙන් කමාන්ඩෝ සහ විශේෂ බලකා සෙබළුන්ගෙන් සමන්විත නිදහස්ආර පැරෂුට් භට කණ්ඩායමක් ඒ සඳහා සහභාගී වූහ. මෙම පැරෂුට් සංදර්ශනයේදී ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ ප්‍රථමවරට ගුවනේ පැරෂුට් කැනපි සංදර්ශනයක් ඉදිරිපත් කිරීමටද ඔවුන්ට හැකිවිය.

ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ තවත් සුවිශේෂ අවස්ථාවක් සනිටුහන් කරමින් කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් අංශය වෙතින් පවත්වනු ලැබූ මූලික පැරෂුට් පාඨමාලා අංක 04 සඳහා නාවික හමුදා සාමාජිකයකුට 1992 සැප්තැම්බර් 14 වන දින අවස්ථාව හිමිවූ අතර, මෙහිදී ලුතිනන් යුඅයි සේරසිංහ ප්‍රථම නාවික හමුදා පැරෂුට් භටයා ලෙස ඉතිහාසයට එක්විය.

නිදහස් ආර පැරෂුට් පුහුණුවීම් ශ්‍රී ලංකාවේම අරඹමින් ප්‍රථම නිදහස් ආර පැරෂුට් පාඨමාලාව 1997 වර්ෂයේදී පවත්වනු ලැබූ අතර, කපිතාන් එන් එල් සිරිමාන්න ප්‍රථම ශ්‍රී ලංකික නිදහස් ආර පැරෂුට් පාඨමාලාව හැදෑරූ හමුදා සාමාජිකයා ලෙස ඉතිහාසයට එක්විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් භටයින්ගේ පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් සහ පැරෂුට් ආශ්‍රිත ක්‍රියාන්විත හැකියාවන් ක්‍රමානුකූලව වර්ධනය වූ අතර, ඔවුන්ට 2000 වර්ෂයේ අගෝස්තු මස ස්ලෝවැකියාවේ පැවැති අන්තර් ජාතික ආරක්ෂක සේවා පැරෂුට් තරගාවලිය නියෝජනය කිරීමට ප්‍රථම වරට අවස්ථාව හිමි විය. ඉන් අනතුරුව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පැරෂුට් කණ්ඩායමක් සෑම වසරක් පාසා මෙම තරගාවලියට සහභාගීවීමට අවස්ථාව හිමිවී ඇති අතර, එහිදී ඔවුන් කැපී පෙනෙන දක්ෂතා දක්වා ඇත.

ශ්‍රී ලංකා පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් නවපිටුවක් පෙරළමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් පුහුණු අංශය විදේශීය

හමුදා සාමාජිකයින් සඳහාද පැරෂුට් පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ලබාදෙන ලදී. එහිදී මාලදිවයින් විශේෂ බලකා හමුදා සාමාජිකයින් දෙදෙනකු 2005 වර්ෂයේදී මෙම පුහුණුව සාර්ථකව නිමකරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් ඉතිහාසයට තවත් පරිච්ඡේදයක් විවර කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් නිලධාරිනියක සහ සෙසුනිලයින් දෙදෙනකු මූලික පැරෂුට් පාඨමාලාව සාර්ථකව හැදෑරූ අතර, එහිදී කපිතාන් වීඑම්එස් විදානගමගේ, කෝප්‍රල් ආර්ඒඑන් හේමන්ති, කෝප්‍රල් පේඑම් කහවල ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා පැරෂුට් භටයින් ලෙස ඉතිහාසයට එක්විය.

කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රය තුළ පැරෂුට් පතිත කලාපයක් ඉදිකරමින් පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් සඳහා වන පහසුකම් තවදුරටත් වර්ධනය කළ අතර, එම පැරෂුට් පතිත කලාපය එවකට කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරි ඉටුකළ වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් විසින් 2010 පෙබරවාරි 08 වන දින විවෘත කරන ලදී.

කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය වෙතින් මූලික පැරෂුට් පාඨමාලාව, ජම්ප් මාස්ටර් පාඨමාලාව, පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ පාඨමාලාව, නිදහස්ආර පැරෂුට් පාඨමාලාව, පාත්ෆයින්ඩර් පාඨමාලාව සහ පැරෂුට් ආශ්‍රිත අනෙකුත් වැඩමුළු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ (විශේෂ කාර්ය බලකා) සාමාජිකයින් සඳහා පවත්වනු ලබයි. ඒ අනුව මේ වනවිට කමාන්ඩෝ පැරෂුට් පුහුණු අංශය වෙතින් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 769 ක් සහ සෙසුනිලයින් 3437 දෙනකු සඳහා (පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරියකු හා සෙසුනිලයකු ඇතුළුව) පුහුණු කරවා ඇති අතර, විදේශීය හමුදා නියෝජනය කරමින් නිලධාරීන් 04 ක් සහ සෙසුනිලයින් 65 දෙනකු පුහුණු කර ඇත.

එමෙන්ම, කමාන්ඩෝ රෙජිමේන්තු සහ විශේෂ බලකා සාමාජිකයන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිදහස් ආර පැරෂුට් භට කණ්ඩායම් විදේශීය හමුදා පැරෂුට් තරඟාවලි සඳහා සහභාගී වී ඒවායින් ජයග්‍රහණ ලබා ශ්‍රී ලංකාවට ගෞරවයක් අත්කරදී ඇත. එහිදී, 2017 වර්ෂයේදී වින්ෂුට් ඉසව්ව සහ නිවැරදි ඉලක්කයට පතිතවීමේ (*ACCURACY LANDING*) ඉසව්වලින් රන් පදක්කම්, 2018 එංගලන්තයේ පැවැති පැරෂුට් තරඟාවලියේදී නිවැරදි ඉලක්කයට පතිතවීමේ ඉසව්වෙන් රන් පදක්කම, 2019 වර්ෂයේ පැවැති අන්තර්ජාතික ආරක්ෂක සේවා පැරෂුට් තරඟාවලියේදී නිවැරදි ඉලක්කයට පතිතවීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කම දිනාගැනීමට හැකිවිය.

එමෙන්ම, චීනයේ හමුදා පෙළපාලියේ සහ පකිස්ථානයේ ජාතික දින සැමරුම වෙනුවෙන් පැවැති පැරෂුට් සංදර්ශන සඳහා ශ්‍රී ලංකා පැරෂුට් භටයින් සහභාගි වූහ. ඊට අමතරව ශ්‍රී ලංකා පැරෂුට් භටයින් භට විදේශීය පැරෂුට් තරඟාවලි සඳහා විනිශ්චයකරුවන් ලෙස සහභාගීවීමටද අවස්ථාව හිමිවී ඇත.

තවද, වින්ඩ්ෂුට් මගින් පැරෂුට් පැනීම් සිදුකිරීමට හැකියාවක් ඇති මෙන්ම ලොව ඉතාමත් භයානක ක්‍රීඩාවක් ලෙස සලකන බේස් ජම්ප් (*BASE JUMP*) පැරෂුට් පැනීමටද හැකියාවක් ඇති ශ්‍රී ලංකාවේ එකම පැරෂුට් කණ්ඩායම ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් කණ්ඩායම දැක්විය හැකිය.

තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් කණ්ඩායම පැරෂුට් භටයින් 09 දෙනකු ගුවනේ පැරෂුට් සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ වැඩිම පැරෂුට් ප්‍රමාණය එකිනෙකට සම්බන්ධ කිරීමේ වාර්තාවටද හිමිකම් කියයි.

දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨතම පැරෂුට් භටයා වන වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ සංග්‍රාමික පැරෂුට් ක්‍රියාන්විත හැකියා වර්ධනය කිරීම සඳහා පුහුණුවීම් ඉහළ තලයකට ගෙන ඒමට පැරෂුට් පුහුණු අංශයට හැකියාව ලැබී ඇත.

එම මඟපෙන්වීම යටතේ පැරෂුට් පුහුණු අංශය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංග්‍රාමික බලය වර්ධනය කිරීමට අඩිතාලමක් යොදා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ගුවන් හමුදාවේ හා නාවික හමුදාවේ සහය ඇතිව ජලය මතට උපක්‍රමික පැරෂුට් පැනීමක් සිදුකිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකිවිය.

තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉදිරි දැක්ම (2020-2025) සංකල්පය යටතේ ක්‍රියාන්විත හැකියාවන් තවදුරටත් වර්ධනය කර ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට රාත්‍රී නිදහස් ආර පැරෂුට් පැනීම් සහ රාත්‍රී උපකරණ පැරෂුට් පැනීම් සිදුකිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකිවිය.

ශ්‍රී ලංකා විශේෂ ක්‍රියාන්විත හමුදාවන්හි සංග්‍රාමික පැරෂුට් හැකියාවන් වර්ධනය කිරීම සඳහා සංග්‍රාමික පැරෂුට් හා පාත්ෆයින්ඩර් පාඨමාලාව නිර්මාණය කළ අතර, මෙම පාඨමාලාව සඳහා නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ විශේෂ ක්‍රියාන්විත හමුදා සාමාජිකයින්වත් අවස්ථාව ලබාදුන් අතර, තවද මෙම පාඨමාලාව වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන උසස් තත්වයේ සංග්‍රාමික පැරෂුට් පුහුණුවීම් වලින් සමන්විත පාඨමාලාවක් වන අතර, 2022 වර්ෂයේ සිට මෙම පාඨමාලාව හැදෑරීමට විදේශීය හමුදා සාමාජිකයින්වද අවස්ථාව ලබා දී ඇත.

තෛපොංගල් දිනයට සරුංගල් සැණකෙළියක්

සිවිල් වැසියන් හා ආරක්ෂක අංශ අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව තෛපොංගල් දිනයට සමගාමීව සංවිධානය කෙරුණු සරුංගල් සැණකෙළියක් කන්කසන්තුරය වෙරළ තීරයේදී පසුගියදා පැවැත්විණ. වසර දෙකකට පමණ පසුව පැවැත් වූ මෙම සැණකෙළිය සඳහා සරුංගල් 200 කට අධික සංඛ්‍යාවක් එක්කර තිබුණු අතර, ඒ සඳහා යාපනය, ඉලවාලෙයි යොවන සමාජවල තරුණ තරුණියන්ගේ සහයෝගය නොඅඩුව ලැබුණි.

මෙම අවස්ථාවට සහභාගී වූ උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් තියාගරාජා මහතා මෙම වැඩසටහන වර්ණවත්ව පැවැත්වීමට යුද්ධ හමුදාව ලබාදුන් දායකත්වය වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමන්ට සහ යාපනය අර්ධද්වීපයේ සේවයේ නියුතු සියලුම ආරක්ෂක අංශ සාමාජිකයන්ට සිය කෘතඥතාව පුද කළේය. ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ 51 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ සම්බන්ධීකරණයෙන් යුතුව පැවැත්වූ මෙම සරුංගල් සැණකෙළියට තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම්, අනෙකුත් රාජ්‍ය නිලධාරීන්, යුද්ධ හමුදා සාමාජිකයින්, සිවිල් වැසියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

දමිළ සෙබළ සෙබළියන් වෙත වියළි සලාක පරිත්‍යාගයක්

තෛපොංගල් උත්සවයට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ගොව්පොළෙහි රාජකාරි නියුතු දමිළ සෙබළ සෙබළියන් 108 දෙනකු සඳහා වියළි සලාක ඇසුරුම් පරිත්‍යාග කිරීම ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 09 වන දින සිදුකරන ලදී.

බලලත් නිලධාරීන් සඳහා නායකත්ව වැඩමුළුවක්

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ රාජකාරී කරනු ලබන හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ රාජකාරී කරනු ලබන රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් හා බලලත් නිලධාරී 11 නිලයේ අයවලුන් හට 2022 ජනවාරි මස 18 හා 19 යන දෙදින තුළ එම මූලස්ථාන ශ්‍රවණාගාරයේදී නායකත්ව ගුණාංග සහ අණදීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් වැඩමුළුවක් පවත්වන ලදී.

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මඟපෙන්වීම යටතේ මෙම වැඩසටහන සඳහා බලලත් නිලධාරී 11 නිලයේ අයවලුන් 110 දෙනකු සහභාගී වූහ. එහිදී, යුද්ධ හමුදා මූලස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් බනි 1 පීජීඑම්එස්එස් ජයවීර යූඑස්පී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය - දියතලාව රාජකාරී කරන ලද රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් වන බනි 1 ඩීබීඑස් හේමචන්ද්‍ර (විශ්‍රාමික) බනි 1 කේආර්ඒ සෙනෙවිරත්න (විශ්‍රාමික) විසින් බලලත් නිලධාරීන්ගේ රාජකාරී සහ වගකීම් කළමනාකරණ හැකියාව, විනය, අවමංගල්‍ය විධි හා ඒ සම්බන්ධ දේශන සිදු කළහ. 56 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී විසින් එහිදී නායකත්වය පිළිබඳ දේශනය සිදුකරන ලදී. වැඩමුළුව අවසානයේ දේශනය සඳහා පැමිණි අයවලුන් වෙත සමරු චිහ්න හා සහතිකපත් පිරිනැමීම 56 වන පාබල සේනාංකාධිපති අතින් සිදු කෙරිණ.

රණවිරු සවියෙන් ඉදිවූ නිවසක්

වව්නියාව ආසිකුලම් හි පදිංචි මොහාන්රාජ් මහේශ්වරි මහත්මිය ගේ පවුල වෙත අලුතින් ඉදිකරන ලද නව නිවසක් පසුගිය ජනවාරි මස 14 වන දින පරිත්‍යාග කෙරිණ. මෙම නිවස භාරදීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා ආඥාපති (වන්නි) මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී වූ අතර, 562 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. නිවස ඉදිකිරීම සඳහා ප්‍රධාන මූල්‍ය දායකත්වය මහේන්ද්‍රරාජා මයුරන්න මහත්මා සහ ඔහුගේ ආදරණීය බිරිඳ වන මයුරනන් මහත්මිය විසින් ලබාදෙන ලදී. 56 වන පාබල සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරීගේ මඟපෙන්වීම යටතේ දියත් කරන ලද 301 ක් වන ප්‍රජා සංවර්ධන වැඩසටහන මෙය වේ.

අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් නව නිවසක්

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බකමූණ, නිකපිටිය ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් ඉදිකිරීමට යෝජිත නව නිවසක් සඳහා පසුගිය 10 වන දින මුල්ගල් තැබිණ. එම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී කර්නල් එන්යූජේඑස් ගුණවර්ධන, 7 වන කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්සීඑස් හරිස්චන්ද්‍ර ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී අයිඒ ඇතුළු තවත් නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචි නිහාල් උඩුගම සූරියගේ මහතා විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය දක්වනු ලබයි. 23 වන පාබල සේනාංකාධිපතිගේ උපදෙස් මත 233 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව්කේ හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පීගේ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ. පී.ඩී. වසන්ත මහතා වෙනුවෙන් ඉදිකරනු ලබන නව නිවස සඳහා අවැසි තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වය 7 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් විසින් සපයනු ලබති.

1 බලකායේ බලකාධිපති ඒකක සංචාරයක

1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ඉකුත් ජනවාරි 19 වන දින විශේෂ බලකායේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදී 4 වන විශේෂ බලකා අණදෙන නිලධාරි ගේ පිළිගැනුමෙන් එහි සපැමිණි බලකාධිපති එහි භටපිරිස් ඇමතීමටද කටයුතු කරන ලදී. එසේම, උසස් පාඨමාලා අංක 23 හදාරන ලද අයවලුන් හට සහතිකපත් ප්‍රදානය කිරීමද එහිදී බලකාධිපති අතින් සිදුවිය.

"සෙබළ සිතට දහම් සිසිල" නවත් අදියරක්

59 වන පාබල සේනාංකය යටතේ පාලනය වන පාබල බලසේනා මූලස්ථාන හා ඒකකයන්හි රාජකාරී කරනු ලබන නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ සහභාගීත්වයෙන් කෝකිලායි ශ්‍රී සම්බෝධි විහාරස්ථානයේදී "සෙබළ සිතට දහම් සිසිල" නමින් සිල් සමාදන්වීමේ වැඩසටහනක් හා බෝධිපූජා පිංකමක් ඉකුත් ජනවාරි 17 වන දින පවත්වන ලදී. එම විහාරස්ථානයේ පැවති ප්‍රථම සිල් සමාදන්වීමේ වැඩසටහන එය වීම විශේෂත්වයකි. ආරක්ෂක සේනා (මූලනිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව 59 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ මඟපෙන්වීම මත මෙම කටයුත්ත සිදුවිය.

මෙම වැඩසටහනට සමගාමීව කෝකිලායි ශ්‍රී සම්බෝධි විහාරස්ථානයට අවශ්‍යව තිබූ ප්ලාස්ටික් පුටු 30 ක ප්‍රමාණයක් ද ආඥාපති ගේ සුරතින් පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාව සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (මූලනිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන්, ආසේම (මූලනිව්) බ්‍රිගේඩියර් ප්‍රමානි බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්ඩීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 591 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් යූඑස්එන්කේ පෙරේරා ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක්ද සහභාගී වූහ.

ආසේමු (මූලනිව්) ආඥාපති බළඇණි පුහුණු පාසල්වල සංචාරයක

57 සහ 68 වන පාබල සේනාංකාධිපතිවරුන් ගේ ආරාධනයකට අනුව ආරක්ෂක සේනා (මූලනිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජනවාරි 11 සහ 18 යන දිනයන්හිදී අම්පකාමම් සහ පුදුකුඩුඉරිප්පු බළඇණි පුහුණු පාසල්වල සංචාරයක නිරත විය. එහිදී ආඥාපති සියලු නිල තේපෑන් සංග්‍රහයකටද එක්වූ අතර, අනතුරුව එහි හටපිරිස් ඇමතීමට ද අමතක නොකළේය.

මෙම අවස්ථාවන් සඳහා 57 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ 68 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේආර්කේකේටී බණ්ඩාර ආර්එස්පී යූඑස්පී, පුහුණු පාසල්වල උපදේශක නිලධාරීවරු ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් රැසක් එක්වූහ.

ආසේමු (බටහිර) ආඥාපති පනාගොඩ යුද්ධ හමුදා කඳවුරේ නිල සංචාරයක

යුද්ධ හමුදාධිපති 2022.01.14 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයෙහි සිදුකළ කඳවුරු සංචාරයෙන් පසු අදාළ නිරීක්ෂණයන් අධීක්ෂණය කිරීම සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය ජනවාරි 25 වන දින පනාගොඩ යුද්ධ හමුදා කඳවුරෙහි සංචාරයක නිරත විය.

මෙම සංචාරයේදී පනාගොඩ යුද්ධ හමුදා කඳවුර තුළ පවතින රෙජිමේන්තු මධ්‍යස්ථාන, බළඇණි, යුද්ධ හමුදා ශාරීරික පුහුණු පාසල, ක්‍රීඩා ගම්මානය, යුද්ධ හමුදා තූර්ය වාදක හා රංග කලා පාසල, යුද්ධ හමුදා මූලික රෝහල, සෙසුනිලයන්ගේ ආහාර පිසින ස්ථාන සහ ආහාර ලබාගන්නා ස්ථාන ආඥාපතිගේ නිරීක්ෂණයට භාජනය විය.

මෙම නිරීක්ෂණ සංචාරය අතරතුර මධ්‍යස්ථාන සේනාධ්‍යක්ෂවරු, අණදෙන නිලධාරීවරු, සූපවේදීන් සහ සෙසුනිලයින් සමග සිය අදහස් හුවමාරු කරගත් ආඥාපති ආහාරවල ගුණාත්මකභාවය, කැලරි ප්‍රමාණය, එහි ප්‍රමිතිය සහ අනෙකුත් ගැටළු පිළිබඳව විමසා බලන ලදී. එසේම, පනාගොඩ යුද්ධ හමුදා කඳවුරු අවට පරිසරයේ පිරිසිදුකමද ඔහුගේ පරීක්ෂාවට බඳුන් විය.

හපුතලේ රෝහල විරු දෑතින් පිලිසකර කෙරේ

හපුතලේ දිස්ත්‍රික් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීගේ ඉල්ලීමකට අනුව 74 වන ජාතික නිදහස් දිනයට සමගාමීව එම රෝහල් පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් පරිදි ඉකුත් පෙබරවාරි 03 වන දින සිදුකරන ලදි. එම අවස්ථාවට මධ්‍යම ආරක්ෂක සේනා මූලස්ථානයේ හා ඊට අයත් ඒකක හටපිරිස් දායක වූහ.

තවද, දියතලාව නගරයේ සිට හපුතලේ වයි හන්දිය දක්වා මාර්ගය හා දියතලාව නගරය කේන්ද්‍රකොට ගනිමින් පොලිතින් උවදුරින් පරිසරයට වන හානිය අවමකර ගැනීම සඳහා වූ ශ්‍රමදාන වැඩසටහනක්ද පසුගිය නිදහස් දිනයට සමගාමීව විසින් දියත් කරන ලදී.

හරිත කෘෂිකර්මාන්ත ගොවිපළ නිරීක්ෂණයට

එළමල්අරාව, පිටපොල, බොරලන්ද "කඳකර" ගැමුණු ගොවි සමිතියට අයත් 2022 යල කන්නයේ වගා කරනු ලබන ගොවි මහතුන්ගේ ගැටලු සොයා බැලීම සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය පෙබරවාරි 02 වන දින නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී ගොවීන් සමග සුහද කතාබහක නිරත වෙමින් නිසි ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොර හා කාබනික දියර යුද්ධ හමුදාවේ මැදිහත්වීම මත ඉදිරියේදී ලබාදීමටද ආඥාපති ඔවුන් හමුවේ පොරොන්දු විය.

කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව

ඉකුත් පෙබරවාරි 04 දිනට යෙදුන 74 වන ජාතික නිදහස් දින සැමරුම් උළෙලේ සම්මාන පෙළපාලිය නියෝජනය කරනු ලැබූ 7000 ක පමණ ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු හටපිරිස් වෙත නොමිලේ නෙස්ටමෝල්ට් පානය ලබාදීමට නෙස්ටමෝල්ට් සමාගම කටයුතු කරන ලදී.

කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය චාමා වනසිංහ මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදුකළ එම කටයුත්තට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.

ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව මගින් සුභසාධක ව්‍යාපෘති පුළුල් කිරීමේ අභිලාශය පෙරදැරි කොටගෙන නව මුදල් ඉපයීමේ ව්‍යාපෘතියක් වශයෙන් සහ ගෑස් භාවිතයට පිළියමක් වශයෙන් පොල් කටු අඟුරු භාවිතාකර අඩු පිරිවැයකින් ආහාර පිසිය හැකි විශේෂ උඳුනක් එළිදැක්වීමේ උත්සවය එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මිහිරි හේරත් මහත්මිය හා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් කිහිපදෙනකුගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි මස 14 වන දින 4 (සෙවි) ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේදී පවත්වනු ලැබූහ.

සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව

සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම එම රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනි දර්ශණී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ජනවාරි 30 වන දින පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගී වූහ. එම අවස්ථාවේදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් 2021.12.23 වන දින සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරි හා සෙසුනිලයන්ගේ දුවා දරුවන් සඳහා ලබාදී තිබූ ශිෂ්‍යත්ව සංකේතාත්මකව එම දරුවන් හට ලබාදීමද සිදුකෙරිණ. තවද, වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව අභිමංසල 3 - පාංගොල්ල සුවසහන මධ්‍යස්ථානයේ සංචාරයක්ද සිදුකරන ලද අතර, එහිදී නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් 40 දෙනකු සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය අඩංගු තෑග පාර්සලය බැගින් පිරිනැමීමද එහි රණවිරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා සිමෙන්ති ගල් 500 ක ප්‍රමාණයක් ප්‍රදානය කිරීමද සිදුකෙරිණ.

පාබල හමුදා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පූර්ණ අධීක්ෂණය, මගපෙන්වීම හා ශ්‍රමදායකත්වය යටතේ ඉංගිරිය පාබල මිටියාවත පරිශ්‍රය තුළ අභිනවයෙන් ඉදිකරන ලද ගැලන්ට් පානීය ජල බෝතල් ව්‍යාපෘතිය යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති ටිජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ඉකුත් ජනවාරි 12 වන දින විවෘත කර ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා සභාපතිනිය ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය වෙත චාරිත්‍රානුකූලව භාරදෙන ලදී. එම අවස්ථාව සඳහා මධ්‍යස්ථාන සේනාධිකායක ඇතුළු නිලධාරීන් සහ පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් සහභාගී වූහ.

තවද, 2021 වසරේ ශිෂ්‍යත්වය සමත් ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින්ගේ දුවා දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම වෙනුවෙන් සංවිධානය කෙරුණු උත්සවයක්ද ඉකුත් ජනවාරි 07 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා සභාපතිනිය ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු දේශන ශාලාවේදී පැවැත්විණි. ඊට සමගාමීව සේවා වනිතා සභාපතිනියගේ අදහසක් මත එම රෙජිමේන්තු ගැලන්ට් බේකරි ආයතනයේ සහ ගැලන්ට් යෝගට් ව්‍යාපෘතියේ රාජකාරි කරනු ලබන සෙසුනිලයින් හා සිවිල් සේවක මහතකුගේ අධ්‍යාපනය ලබන දු දරුවන් හට තම අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා පාසල් උපකරණ පරිත්‍යාගයක් ද සිදු කරන ලදී. එම අවස්ථාව සඳහා සේවාවනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් සහ නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව

සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව වෙතින් මියගිය/ආබාධිත රණවිරුවන් හට සෙත් පතා වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ දහවල් සහ රාත්‍රී දානය ලබාදීම එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව

ගැමුණු හේවා බලකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ගීතා අතුකෝරල මහත්මියගේ අදහසකට අනුව දරුවන් තිදෙනකුට වැඩියෙන් සිටින එම රෙජිමේන්තුවේ රණවිරුවන් හා සිවිල් සේවක මහතුන් 79 දෙනකු ගේ දුවා දරුවන් 247 දෙනකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහි පළමුවන අදියර ලෙස ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලට අයත් රණවිරුවන්ගේ හා සිවිල් සේවක මහතුන් ගේ දුවා දරුවන් 56 දෙනකු වෙත පාසල් උපකරණ බෙදා දීම ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී 2021 දෙසැම්බර් 30 වන දින සිදු කෙරිණ.

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව

1 වන ගැමුණු හේවා බළඇණියට අයත් සෙ/42340 ලාන්ස් කෝප්‍රල් ද සොයිසා ඩීසීකේ යන කොනොනි ගේ පිළිකා රෝගී දියණිය හා හෘද රෝගයෙන් පෙළෙන දියණිය වෙනුවෙන් වෛද්‍යාධාර ලෙස මසකට රු: 5000.00 බැගින් වසරක කාලයක් පුරා ලබාදීමට ගැමුණු හේවා බලකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව ක්‍රියා කරන ලදී. එහි සභාපතිනි ගීතා අතුකෝරල මහත්මිය ගේ අදහසකට අනුව ක්‍රියාත්මක මෙම මානුෂීය සත්කාරය යටතේ පළමු රු: 5000.00 ක වාරිකය සමග පාසල් උපකරණ හා රු: 20000.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක ලබාදීම ඉකුත් ජනවාරි 04 වන දින සිදු කෙරිණ. එහිදී සේවා වනිතා සභාපතිනිය ගේ සුරතින් අදාළ ද්‍රව්‍ය එම කොනොනිගේ ගාල්ලේ පිහිටි නිවසටම ගොස් ලබාදීම විශේෂත්වයකි.

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන මහත්මිය ගේ අධීක්ෂණය යටතේ සහ අනෙකුත් සාමාජිකාවන්ගේ සහයෝගයෙන් ඉසේබට අයත් නිලධාරීන් හා සෙසුනිලයන්ගේ සාමාන්‍ය පෙළ සමත් හා උසස් පෙළ හදාරනු ලබන දු දරුවන් වෙනුවෙන් "උසස් අධ්‍යාපන මාවත් හඳුනාගනිමු" යන මැයෙන් පවත්වන සම්මන්ත්‍රණ මාලාවේ පළමු වැන්න ජීව විද්‍යා අංශයේ දු දරුවන් සඳහා ඉකුත් ජනවාරි 27 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සම්මන්ත්‍රණ ශාලාවේ සිට මාර්ගගත *(Online)* තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය 11 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඒඑම්ඒඑස් අලුගොල්ල ගේ බිරිඳ හා කථිකාචාර්ය ආචාර්ය තුවන්ති කටුවාවිල යන මහත්මීන් විසින් පවත්වනු ලැබූහ.

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා වනිතා ශාඛාව

ශ්‍රීලංකා රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතුව සිට විවිධ හේතූන් මත මියගිය රණවිරුවන් සිහිකිරීම හා රණක්ෂිතයට පත් හා රාජකාරී නියුතු රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ට සෙත්පතා බෝධි පූජා පිංකමක් එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 04 වන දින උත්තර සාලිය ශ්‍රී දළදා රජමහා විහාරස්ථානය - සාලියපුර හිදී පවත්වන ලදී. මේ සඳහා ආරාධනා භකාස අණසක හා ශ්‍රීලංකා බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් මෙන්ම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ. සභාපතිනියගේ මඟපෙන්වීම යටතේ 5 ශ්‍රීලංකා සාලියපුර සහ ශ්‍රීලංකා (සන්නද්ධ) බලඇණිය - සාලියපුර යටතේ රාජකාරී නියුතු සියලුම නිලධාරී, සෙසුනිල සහ සිවිල් සේවක මහතුන්ගේ පාසල් දරුවන් 334 දෙනකු වෙත නොමිලේ පාසල් නිල ඇඳුම් පිරිනැමීමටද එහිදී කටයුතු කෙරිණි. රට තුළ පවතින *COVID -19* වසංගත තත්වය සැලකිල්ලට ගෙන පාසල් සිසු දරුවන් 35 දෙනකු ගේ සහභාගීත්වයෙන් අදාළ වැඩසටහන ඉකුත් පෙබරවාරි 05 වන දින 5 ශ්‍රීලංකා - සාලියපුර හිදී පවත්වනු ලැබූහ.

තවද, මෙම අවස්ථාවේදී 5 ශ්‍රීලංකා යටතේ රාජකාරී නියුතු සෙ/627781 බනි I ඩීඑම්ආර්කේ දිසානායක යන බලලත් නිලධාරී ගේ අවුරුදු 12 ක් වයසැති විශේෂ අවශ්‍යතාවන් සහිත දරුවකු හට රු: 280,000.00 පමණ වටිනාකමකින් යුතු විශේෂයෙන් නිෂ්පාදිත විදුලි රෝද පුටුවක් පරිත්‍යාග කිරීමද ආරාධනා භකාස අණසක හා ශ්‍රීලංකා බලකාධිපති ගේ සුරතින් සිදුකෙරිණ.

පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා රැස්වීම 2022 ජනවාරි මස 08 වන දින පැවැත්විණි. මෙම අවස්ථාවට එරංගා හේවාවසම් මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූ අතර, එහිදී සම්ප්‍රදායානුකූලව නව කාර්යාලය පොල්තෙල් පහන දල්වමින් සුබ මොහොතින් විවෘත කිරීමද සිදුකෙරිණ. ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාවේ නව නිලධාරී මඩුල්ල එහිදී නව තනතුරුවල වැඩභාර ගන්නා ලද අතර, ඊට සමගාමීව සිවිල් සාමාජිකයන් සඳහා දිවා ආහාර වේලක් ලබාදීමද, පාසල් ළමුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමද, ආබාධිත තත්වයට පත් වූ සෙසුනිලයකුගේ පවුලේ සාමාජිකයකු වෙනුවෙන් අත්වාරු යුගලක් පරිත්‍යාග කිරීමද එහිදී සිදුකෙරිණ.

කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාව

"මව්බිමට සෞභාග්‍ය" යන තේමාව යටතේ අරලංගවිල කෘෂිකර්ම පුහුණු පාසල් භූමියේ වගා කරන ලද දේශීය වී වගාවේ ගොයම් කැපීමේ මංගල්‍යය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 19 වන දින උදෑසන උත්සවාකාරයෙන් පැවැත්විණ. එහිදී, 3(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා අණදෙන නිලධාරී වෙත ස්වයංජාත ඇල් වී (බීජ වී) ප්‍රදානය කිරීමද සේවා වනිතා සභාපතිනියගේ සුරතින් සිදුවූවාය. අදාළ බීජ වී වගා කොට ව්‍යාප්ත කර සියලු සාමාජිකාවන් හට තම නිවසේ ඒවා වගා කිරීමට සලස්වා ඖෂධීය ගුණයෙන් යුත් පෝෂණීය ආහාර වේලක් සපයාගැනීමට සියලු සාමාජිකාවන් දිරිමත් කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණයි.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාව

2021 වසරේ ශිෂ්‍යත්වය සමත් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සාමාජිකයින්ගේ දුවා දරුවන්ට ත්‍යාග සහ බැංකු පාස්පොත් පිරිනැමීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 30 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් හෙරලියවත්ත කඳුවුරු දේශන ශාලාවේදී පැවැත්විණ.

කෘත්‍රිම අත් පා නිෂ්පාදනය කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ක්ෂේත්‍ර වැඩපළක්

කෘත්‍රිම පාද පලඳිනු ලබන අයවලුන් හා ඒවා පලඳින ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා නව කෘත්‍රිම පාද නිෂ්පාදනය කර ලබාදීමේ හා දෝෂ සහිත කෘත්‍රිම අත් පා අලුත්වැඩියා කොට යථා තත්වයට පත් කිරීම වෙනුවෙන් නව ක්ෂේත්‍ර වැඩපළක් පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන රණවිරු සෙවණ රාගම හිදී පසුගිය පෙබරවාරි 02 වන දින විවෘත කෙරිණ. මෙම ක්ෂේත්‍ර වැඩපළ මගින් රණක්ෂිතයට පත් ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් සේවයේ නියුතු/විශ්‍රාමික සැමට සේවය ලබාගත හැක.

ආරක්ෂක අමාත්‍යාංශය හා ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ මැදිහත්වීම මත ඉන්දියාවේ ජයිපුර්හි පිහිටි හගවාන් මහාවීර් විකලාංග ආයතනයේ අනුග්‍රහයෙන් මෙම ක්ෂේත්‍ර වැඩපළ දින 35 ක් පුරා රණවිරු සෙවණ රාගම හිදී පැවැත්වීමට නියමිතව ඇත. ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් සාමාජිකයින් 450 දෙනකු සඳහා මෙමගින් අවස්ථාවක් ලබාදීමට නියමිතය.

එම සමාරම්භක උත්සවයට අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, ඉන්දීය මහකොමසාරිස් තුමා, රණවිරු සේවා අධිකාරියෙහි අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ජීඑම්සීකේබී ඒකනායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී (විශ්‍රාමික) සහ එහි සභාපති මේජර් ජෙනරාල් නන්දන සේනාධීර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී (විශ්‍රාමික) ඇතුළු ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් රැසක් සහභාගී වූහ.

ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා අංක 54

යුද්ධ හමුදාවෙහි සාමාන්‍ය සෙබළ, ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ උපදේශක හැකියාව වර්ධනය කරමින් හමුදා ජීවිතයේ අනාගත අභිවෘද්ධිය උදෙසා වෘත්තීය නිපුණත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා වූ පාඨමාලාවක් සටන් පුහුණු පාසල - අම්පාර හිදී පසුගිය ජනවාරි 31 වන දින සාර්ථකව අවසන් විය. මෙම පාඨමාලාව සඳහා සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන යටතේ ඇති නිත්‍ය/ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 234 දෙනකු සහභාගී වූහ. මෙහි සමාප්ති දේශනය පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරනු ලැබීය.

දැනුවත් කිරීමේ දේශනයක් 1 බලකා මූලස්ථානයේදී

1 බලකාය සහ ඒ යටතේ පාලනය වන 53 වන පාබල සේමු, කම බසේමු, වීබ බසේමු වෙත අයත් නිලධාරීන් හා සෙසුනිලයින් සඳහා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබාදෙන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පසුගිය පෙබරවාරි 08 වන දින 1 බලකා මූලස්ථානයේදී පවත්වන ලදී. ඒ සඳහා නිලධාරීන් තිදෙනකු හා සෙසුනිලයින් 98 දෙනකු සහභාගී වූ අතර, 58 වන පාබල සේනාංකයේ සෙනීන් ද ඊට *ZOOM* තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූහ.

අවසන් උණ්ඩය දක්වා සටන් වැද

මුහුදුබත් වූ යුද නෞකාව "බිස්මාක්"

සටහන:
ලුතිනන් දුමින්ද පෙනාන්ඩු,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

දෙවන ලෝක යුද්ධ සමය තුළ ජර්මනිය විසින් නිර්මාණය කරන ලද දැවැන්තම යුද නෞකාවන් අතුරින් ඉතිහාසයේ කිසිදා නොමැකෙන මහක සටහනක් ඉතිරි කරමින් මුහුදුබත් වූ යුද නෞකාවක් වශයෙන් "බිස්මාක්" නෞකාව ඉතිහාසයට එක් වී ඇත. ඒ අනුව එවකට ජර්මනියේ ආඥාදායකයා වූ ඇඩෝල්ෆ් හිට්ලර්ගේ සංකල්පයක් හා අනුග්‍රහය මත දෙවන ලෝක යුද්ධය වෙනුවෙන්ම මෙම සුවිශේෂ ජර්මානු යුද නෞකාව නිපදවීමට කටයුතු සැලසුම් කර තිබුණි.

පළමු ලෝක යුද්ධයේදී මෙන්ම දෙවන ලෝක යුද්ධ සමයේත් දැවැන්ත විනාශයන්ට මුලපුරමින් ඊට සක්‍රියව දායක වූ ජර්මනියට ඒ වනවිටත් එවකට මහා බ්‍රිතාන්‍යයේ රාජකීය නාවික හමුදාව සතු වූ දැවැන්ත යුද නෞකාවන්ට අභියෝගයක් විය හැකි මට්ටමේ දියුණු තාක්ෂණයකින් යුත් යුද නෞකාවක අවශ්‍යතාවය තදින්ම දැනී තිබුණි. ඒ අනුව ජර්මානු යුද විශේෂඥයන්ගේ තාක්ෂණික ඥානය මත ඉදි කෙරෙමින් පැවති "බිස්මාක්" යුද නෞකාව ඒ වන විටත් ජර්මනිය සතු වූ දැවැන්තම යුද නෞකා යුගලයන්ගෙන් එකක් විය. ඒ නිසාවෙන්ම මෙම නෞකාව බිස්මාක් ක්ලාස් බැට්ල්ෂිප් (*Bismarck Class Battleship*) යන අන්වර්ථ නාමයෙන් හැඳින්වීමට එවකට සිටි ජර්මානු බලධාරීන් විසින් පියවර ගන්නා ලදී.

ඒ අනුව 1936 වර්ෂයේදී සැලසුම් කරන ලද පරිද්දෙන් "බිස්මාක්" ඇතුළු තවත් යුද නෞකාවක් නිර්මාණය කිරීමට ජර්මනිය විසින් පියවර ගන්නා ලදී. සැලසුම් කළ පරිද්දෙන් 1939 වසර අග භාගය වන විට "බිස්මාක්" නෞකාවක් ද 1940 වසර නිමා වන විට බිස්මාක් නෞකාවේම සොහොයුරිය ලෙසින් "ටර්මිට්ස්" *(Termits)* යන නමින් හඳුන්වන ලද තවත් දැවැන්ත යුද නෞකාවකද නිෂ්පාදන කටයුතු සාර්ථක අයුරින් නිම කිරීමට ජර්මනියට හැකි විය.

කෙසේ වුවත් "බිස්මාක්" යුද නෞකාවේ ඉදිකිරීම් කටයුතු ස්ථිර වශයෙන්ම ආරම්භ කරන ලද්දේ 1936 වසරේ ජූලි මස 01 වන දිනයි. ඒ අනුව 1939 වසරේ පෙබරවාරි මස 14 වන දින එහි සියලුම නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන්ම නිමාකරන ලද අතර, 1940 වසරේ අගෝස්තු මස 24 වන දා සිට "බිස්මාක්" යුද නෞකාව ජර්මානු නාවික හමුදාවේ සේවය වෙනුවෙන් යොදා ගනු ලැබුවේ

එය ජර්මන් ආඥාදායක ඇඩොල්ෆ් හිට්ලර් විසින් අධිකාරියට පත්කිරීමෙන් අනතුරුවය.

බරින් ටොන් 58,000 ක් හා දිගින් අඩි 825 ක් පමණ වන මෙම දැවැන්ත ජර්මානු යුද්ධ නෞකාව තුළ අඟල් 15 ක පමණ වූ විශ්කම්භයක් සහිත අති දැවැන්ත කාල තුවක්කු 08 ක් සහ තවත් ප්‍රබල ගිනි අවි රැසක් ස්ථාපිත කර තිබුණි. එමෙන්ම, මෙම නෞකාවේ තිබූ තවත් සුවිශේෂත්වයක් වූයේ එය සතු වූ අඟල් 7 ක පමණ ඝණත්වයකින් යුත් දැඩි වානේ තහඩු යොදා සකසන ලද එහි බඳ පෙදෙසයි. දැඩි හා ශක්තිමත් වානේ බඳ තහඩු එම නෞකාවේ සමස්ත ශක්තිය තව තවත් වර්ධනය කිරීමට හේතු විය. එමෙන්ම දැඩි පීඩනයක් සහිත වාෂ්ප ටර්බයිනයන් 03 කින් සහ ඉන්ධන බලයෙන් ක්‍රියා කරන බොයිලේරු 12 කින් සමන්විත "බිස්මාක්" නෞකාවේ අශ්වබල 1,48,116 ක තරම් වූ බලයක් උත්පාදනය කළ හැකි වූ අතර, එසේ උත්පාදනය කළ ශක්තිය භාවිත කරමින් පැයට කිලෝමීටර 55.8 ක වේගයකින් (නොට් 30.1 ක) ගමන් කිරීමේ හැකියාවද ඊට ලැබී තිබුණි. ඒ අනුව, 1940 කාලවකවානුව තුළ ලෝක ඉතිහාසය තුළ නිර්මාණය කරන ලද "විශිෂ්ටතම හා වේගවත්ම නෞකාව" ලෙස විරුදාවලිය ලැබූ බිස්මාක් නෞකාව එනමින් නම් කිරීමට හේතු වූයේ එවකට ජර්මනිය එක්සේසත් කළ පළමු චාන්සලර් වරයා වූ "ඔටෝ වොන් බිස්මාක්" සිහිපත් කරවීම සඳහායි. එම චාන්සලර්වරයා ඩෙන්මාර්කයට, ඕස්ට්‍රියාවට මෙන්ම ප්‍රංශයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ ආක්‍රමණශීලී පාලකයෙකු මෙන්ම ඕස්ට්‍රියානු යුද්ධය ජයග්‍රහණය කිරීමට සමත් වූ අතර, 1887 සිට 1890 දක්වා කාල සීමාව තුළ ජර්මනියේ චාන්සලර්වරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ප්‍රධාන අමාත්‍යවරයා ලෙසත් කටයුතු කර තිබුණි.

කෙසේ වුවත්, 1940 වර්ෂය වන විට ලොව සියලුම නාවික හමුදාවන් අතර ඉදිරියෙන්ම සිටි බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවටවත් එවකට ජර්මනිය සතුව පැවති මෙකී "බිස්මාක්" නෞකාවට සම කළ හැකි මට්ටමේ යුද නෞකාවක් නොතිබිණි. එමෙන්ම සතුරු ආක්‍රමණයකට එළඹීමේදී බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවට නොදෙවෙනි නාවික බලයක් සහිත නාවික හමුදාවක් බිහි කිරීම ජර්මානු ආඥාදායක ඇඩොල්ෆ් හිට්ලර්ගේ බලවත් අභිලාෂයක් වී තිබුණි.

එමෙන්ම, මෙම වකවානුව තුළ ජර්මන් නාවික හමුදාව "ක්‍රිග්ස්මැරින්" (*Kriegsmarine*) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වාදී තිබූ අතර, 1939 ඇරඹී දෙවන ලෝක යුද්ධයේ වඩාත් ප්‍රහාරාත්මක සමුද්‍ර අවිය ලෙස බිස්මාක් යුද්ධ නෞකාව දෙවන ලෝක යුද්ධයට අවතීර්ණ වී තිබුණි.

1939 ජර්මනිය විසින් චෙකොස්ලෝවැකියාව සහ පෝලන්තය ආක්‍රමණය කළ අතර, 1940 වන විට ඩෙන්මාර්කය හා නෝර්වේ රාජ්‍යයද ආක්‍රමණය කිරීමට ජර්මනිය සමත් විය. තවද, බ්‍රිතාන්‍යයට ප්‍රබල අභියෝගයක් වෙමින් දිගින් දිගටම ගුවනින් ප්‍රහාර දියත් කළත් බ්‍රිතාන්‍ය යටත් කර අත්පත් කරගැනීමේ හැකියාවක් ජර්මනියට නොතිබුනේ මහ සයුරින් එහි ළඟා වීමට තිබූ නොයෙකුත් බාධක හා දුෂ්කරතාවන් මෙන්ම එවකට බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව සතුව පැවති විශිෂ්ට යුද උපක්‍රම නිසාවෙනි. එමෙන්ම, ජර්මනිය සතු බිස්මාක් යුද නෞකාවේ දැවැන්ත බව හා එහි ඇති ප්‍රබල යුද ශක්තිය පිළිබඳ මනා අවබෝධයක්ද විවිධ ඔත්තු සේවාවන් හරහා ඒ වනවිටත් බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව වෙත ලැබෙමින් පැවතුණි.

අත්ලාන්තික් සාගරයේ සිදුකරන ලද ඉතා රහසිගත මෙහෙයුමක් වෙනුවෙන් "බිස්මාක්" යුද නෞකාව වර්ෂ 1941 මැයි මස 19 වන දින හිමිදිරි උදෑසන දියත් කරන ලද්දේ එවකට ඇමරිකාවේ සිට මහා බ්‍රිතාන්‍ය දක්වා ඉන්ධන ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැගත් මිත්‍ර පාර්ශ්වික රටවල යුද නෞකාවන්ට සැඟව සිට ප්‍රහාර එල්ල කිරීමේ මූලික අරමුණ පෙරදැරි කරගෙනය. ඒ වෙනුවෙන් "බිස්මාක්" යුද නෞකාවට සහය වීම සඳහා "ප්‍රින්ස් ඉවුගන්" (*Prince Eugen*) නමැති යුද නෞකාවක්ද එම ප්‍රහාරයන් සිදුකිරීම වෙනුවෙන් එකී මෙහෙයුමට එක්ව තිබුණි. කෙසේ වුවද, මිත්‍ර පාර්ශ්වික රටවල්වලින් එවනු ලැබූ යුද නෞකාවන් වෙත රහසිගතව ප්‍රහාරයක් එල්ල කිරීමට ජර්මානුවන් සැලසුම් කර ඇති බවත් ඒ සඳහා ඔවුන් "බිස්මාක්" යුද නෞකාව ඇතුළු තවත් යුද නෞකාවක් අත්ලන්තික් සාගරය වෙත එවා ඇති බවත් තම ඔත්තු සේවාවන් හරහා දැනගත් බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව ඊට සූදානම්වීම සඳහා එච්එම්එස් හූඩ් (*HMS Hood*) සහ ප්‍රින්ස් ඔෆ් වේල්ස් (*Prince of Wales*) නම් බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවට අයත් යුද නෞකාවන් දෙකක් අත්ලන්තික් සාගරය බලා කඩිනමින් යාත්‍රා කරවීමට කටයුතු යොදවන ලදි.

එවකට "බිස්මාක්" නෞකාවේ පළමුවන කපිතාන්වරයා වශයෙන් වැඩ භාරගනු ලැබූ අද්මිරාල් ගුන්තර් ලුජන්ස් (*Admiral Gunther Lutjens*) ගේ අණදීම මත අත්ලාන්තික් සාගරයේ යාත්‍රා කළ මෙම ජර්මානු යුද නෞකාවේ ඇති යුද ශක්තිය පිළිබඳ මනා අවබෝධයක් නොතිබූ නිසාවෙන් බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව ස්පිට්ෆයර් (*Spitsfire*) නම් ප්‍රසිද්ධ ඔත්තු සේවා ගුවන් යානා හරහා ලැබුණු තොරතුරු මත එම නෞකාව විනාශ කරලීම වෙනුවෙන් සිය මුළු නාවික හා ගුවන් හමුදා ශක්තියම යෙදවීමට ඒ වනවිටත් කටයුතු සැලසුම් කර තිබුණි.

කෙසේ වුවද එවකට නිර්මාණය කරන ලද දැවැන්තම යුද නෞකාව වීම හේතු කොට ගනිමින් එය හැකි ඉක්මනින් යුද්ධයට සහභාගී කරවීමටත්

බිස්මාක් නෞකාව

වඩා ජර්මානු නිලධාරීන්ට අවශ්‍ය වී තිබුණේ අත්ලන්තික් සාගරය හරහා මහා බ්‍රිතාන්‍ය වෙත ඉන්ධන ඇතුළු අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යමින් තිබූ නෞකාවන්ට සැඟව සිට ප්‍රහාර එල්ල කොට නිරුපද්‍රිතව පලායාමයි. එහි තිබූ තවත් දැවැන්තම අඩුපාඩුවක් වූයේ නියමිත ප්‍රමිතියට අනුව සකසා පරීක්ෂාවට ලක් කරන ලද ගුවන් යානා නාශක පද්ධතියක් එහි නොතිබීමයි. නෞකාවේ තිබූ රේඩාර් පද්ධතියට ප්‍රහාර සඳහා දුර නිර්ණය කිරීමේ හැකියාවක් තිබූ නමුත් ඈත සිට නෞකාව දෙසට පැමිණෙන වස්තූන් නිසිආකාරව හඳුනාගැනීමේ හැකියාවක් ඊට නොතිබුණි. බිස්මාක් නෞකාව නෝර්වේ වරායෙන් පිටව යද්දීත් එම නෞකාවේ සිටි නිලධාරීන්ට විශාලතම අතපසුවීමක් සිදුවිය. එනම්, නෞකාවට ප්‍රමාණවත් අයුරින් ඉන්ධන පුරවා ගැනීමට අමතක වීම යුද්මය වාතාවරණයක් තුළ කිසිසේත් සිදු නොවිය යුතු තත්වයක් මෙන්ම ජර්මානු නිලධාරීන්ට සිදු වූ දැවැන්තම අතපසුවීමකි.

මේ අතරතුර "බිස්මාක්" නැවේ සම්ප්‍රාප්තිය අපේක්ෂා කරමින් ඒ වනවිටත් ඩෙන්මාක් සමුද්‍ර සන්ධිය අසල බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවට අයත් එච්එම්එස් හුඩ් (*HMS Hood*) සහ ප්‍රින්ස් ඔෆ් වේල්ස් (*Prince of Wales*) යන නෞකාවත් රැක සිට තිබුණි. ඒ අයුරින්ම "බිස්මාක්" නෞකාව මහ සයුරේ දර්ශනය වීමත් සමගින් එම නෞකාව වෙත දැවැන්ත කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල කිරීමට එච්එම්එස් හුඩ් නෞකාව කටයුතු කළේය. ඊට ප්‍රතිචාර ලෙස "බිස්මාක්" නැව ප්‍රතිප්‍රහාරයක් එල්ල කිරීමත් සමගින් මිනිත්තු ගණනාවක් පුරා එම නෞකාවන් අතර දැවැන්ත කාලතුවක්කු වෙඩි ප්‍රහාරයක් හුවමාරු වූයේ අහස් තලය දෙදරවමිනි.

එමෙන්ම, ප්‍රතිප්‍රහාරයක් වශයෙන් "බිස්මාක්" නෞකාව විසින් එල්ල කරන ලද කාලතුවක්කු ප්‍රහාරයන් ඉතාමත් ප්‍රබල වූ අතර එමගින් නිකුත් වූ කාලතුවක්කු ප්‍රහාරයන්හි කම්පනය දරාගත නොහැකි වීමෙන් බිස්මාක්හි ඉදිරියෙන් පිහිටි රේඩාර් පද්ධතිය පවා සම්පූර්ණයෙන්ම බිඳ වැටිණි. මේ නිසාවෙන්ම ඉන්පසු ගමනේ පෙරමුණ ගැනීමට සිදුවූයේ "බිස්මාක්" නෞකාවේ සහයට පැමිණි ප්‍රින්ස් ඉවුගන් (*Prince Eugen*) නෞකාවටය.

එමෙන්ම, පළමු හමුවෙන්ම "බිස්මාක්" නෞකාවේ දැවැන්ත යුද ශක්තිය මැනවින් වටහා ගත් බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව සිය දෙවන හමුවේදී "එච්එම්එස් හුඩ්" නෞකාව යොදා ගනිමින් තවත් ප්‍රහාරයක් "බිස්මාක්" වෙත එල්ල කිරීමට කටයුතු සැලසුම් කරන ලදී. ඒ අනුව මහ සයුරේ පාවෙන ප්‍රබලම හා බිහිසුණුම යුද නෞකාවන් දෙක වූ "බිස්මාක්" සහ "එච්එම්එස් හුඩ්" මුහුණට මුහුණ ගැටීම වෙනුවෙන් තවත් වරක් සූදානම් වූ අතර, එහිදී එච්එම්එස් හුඩ් නෞකාවට බරපතල අතපසුවීමක් සිදු වූයේ බිස්මාක් නෞකාව ලෙස වරදවා වටහාගනිමින් "ප්‍රින්ස් ඉවුගන්" නෞකාවට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමත් සමගිනි. ඒ සමගින් එහි වාසිය ලබා ගත් "බිස්මාක්" නෞකාව තවත් දැවැන්ත කාලතුවක්කු ප්‍රහාර කිහිපයකම "එච්එම්එස් හුඩ්" නෞකාවට එල්ල කරනුයේ බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවේ හඳවත බඳු වූ එච්එම්එස් හුඩ් නෞකාවේ සිටි නාවිකයින් 1400 ක් දෙනා සමගින් එම නෞකාව මුහුදුබත් කරවමිනි. "බිස්මාක්" විසින් "එච්එම්එස් හුඩ්" නෞකාව මුහුදුබත් කළ අයුරු සියැසින් දුටු ප්‍රින්ස් ඔෆ් වේල්ස් නෞකාවේ සිටි නාවික නිලධාරීන් "බිස්මාක්" නෞකාව වෙත තවත් දැවැන්ත කාලතුවක්කු ප්‍රහාර කිහිපයක්ම පිට පිට එල්ල කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බිස්මාක් නෞකාවේ බඳට දරුණු හානි සිදු වී එහි ඉන්ධන කාන්දුවක්ද හට ගෙන තිබිණි. කෙසේ වෙතත් බිස්මාක් වෙතින් එල්ල වූ දරුණු කාලතුවක්කු ප්‍රහාරයන් මුහුණ දී ගත නොහැකි වූ ප්‍රින්ස් ඔෆ් වේල්ස් ක්‍රමයෙන් පසුබැස යද්දී "බිස්මාක්" නෞකාව ප්‍රංශය බලා වේගයෙන් යාත්‍රා කරවීමට එහි කපිතාන්වරයා වූ අද්මිරාල් ගුන්තර් ලුජන්ස් සිය කාර්ය මණ්ඩලය වෙත උපදෙස් ලබා දී තිබුණි.

බිස්මාක් බ්‍රිතාන්‍ය රේඩාර් පද්ධතියට හසු නොවන ලෙස ගමන් කළත් මුහුදේ තිබූ තෙල් පැල්ලම් නිරීක්ෂණය කරමින් ඒ ඔස්සේ එම නෞකාව ගමන් කරන දිසාව සොයා ගැනීමට බ්‍රිතාන්‍ය ගුවන් හමුදා සමත් වී තිබුණි. එමෙන්ම, බිස්මාක් වෙත ප්‍රහාර එල්ල කිරීමට හොඳම මග ගුවන් හමුදා යානා යොදාගෙන ප්‍රහාර එල්ල කිරීම බව හඳුනාගත් මහා බ්‍රිතාන්‍යයේ රාජකීය නාවික හමුදාව ගුවන් යානා විශාල ප්‍රමාණයක් යොදවා ගනිමින් "බිස්මාක්" නෞකාවට ප්‍රහාර එල්ල කිරීම සඳහා පිටත් කර යවන ලදී. තවද, එච්එම්එස් රොඩනි (*HMS Rodney*) නමැති තවත් ප්‍රබල යුද නෞකාවක්ද බිස්මාක් නෞකාව ලුහුබැඳ ගියේ අවස්ථාව ලද සැනින් තවත් මාරාන්තික ප්‍රහාරයක් ඊට එල්ල කිරීමේ බලාපොරොත්තුවෙනි.

මේ අනුව ප්‍රංශයට නාවික සැතපුම් කිහිපයක් තිබියදී "බිස්මාක්" නෞකාව වටලන ලද බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවට අයත් ගුවන් යානාවත් හා මිත්‍ර පාර්ශ්වික රටවල්වලට අයත් තවත් නෞකාවක් මෙම තනි නෞකාව වෙත පිට පිට දැවැන්ත කාලතුවක්කු ප්‍රහාරයන් එල්ල කළ අතර, ඒවාටද මුහුණ දෙමින් සිය අවසන් උණ්ඩය දක්වාම සටන් වැදීමට බිස්මාක් නෞකාවේ කපිතාන්වරයා තීරණය කර තිබිණි. එමෙන්ම, තමන් කිසිසේත් යටත් නොවන බවත්, "බිස්මාක්" නෞකාවේ ඇති අවසන් උණ්ඩය දක්වාම සටන් වැදීමට තමා කටයුතු කරන බවත්, එම නෞකාවේ කපිතාන් වරයා වන අද්මිරාල් ගුන්තර් ලුජන්ස් (*Admiral Gunther Lutjens*) විසින් එවකට ජර්මනියේ ආඥාදායකයා වූ ඇඩොල්ෆ් හිට්ලර් වෙත රේඩියෝ පණිවුඩයක් මගින් දන්වා යවන ලදී. තවද, බිස්මාක් විසින් එල්ල කරන ලද ප්‍රතිප්‍රහාරයන් හමුවේ ඊට පහර දීමට පැමිණි ගුවන් යානා රැසක්ද විනාශයට පත් විය. කෙසේ වුවත් මේ සා අති විශාල නාවික බලයක් සමග තනිව සටන් වැදි බිස්මාක් එල්ල වූ දරුණු ප්‍රහාර හමුවේ එය ක්‍රම ක්‍රමයෙන් දුර්වලවීමට පටන්ගෙන තිබූ අතර, එහි තිබූ කාලතුවක්කු උණ්ඩද ක්‍රම ක්‍රමයෙන් අවසන් වීමට පටන් ගෙන තිබුණි. ඒ අනුව, වර්ෂ 1941 මැයි මස 27 වන උදෑසන තෙක් ඇවිලී ගිය එම බිහිසුණු සටන අවසන් වීමට මිනිත්තු කිහිපයකට ප්‍රථම ලද අවස්ථාවකින් ප්‍රයෝජනය ගත් "එච්එම්එස් රොඩනි" (*HMS Rodney*) නෞකාවෙන් එල්ල වූ තවත් බිහිසුණු කාලතුවක්කු ප්‍රහාර කිහිපයකින් අනතුරුව එතෙක් තනිවම සටන් වදිමින් සිටි "බිස්මාක්" නෞකාව මුහුදුබත් වූයේ එහි සිටි ජර්මානු සෙබළුන් දෙදහසකට ආසන්න පිරිසකටද තම දිවි අහිමිකරවමිනි.

එමෙන්ම, තම දිවි ගලවා ගැනීම සඳහා දියේ පොර බදිමින් සිටි ජර්මන් සෙබළුන් දෙස සානුකම්පිතව සලකා බැලූ බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව දියේ ගිලෙමින් සිටි ජර්මානු සෙබළුන් පිරිසකගේ දිවි බේරා ගැනීමටද කටයුතු කර තිබුණි.

නායකත්ව ගුණාංග වර්ධනයට වැඩමුළුවක්

143 වන පාබල බලසේනාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ හලාවත නාත්තන්ඩිය මට්ටාකොටුව කනිෂ්ඨ විද්‍යාලයේ නව ශිෂ්‍ය නායක මණ්ඩලය වෙත නායකත්ව ගුණාංග වර්ධනය කිරීමේ අරමුණින් වූ දෙදින පුහුණු වැඩමුළුවක් පසුගිය පෙබරවාරි 28 වන දින සහ 29 යන දිනයන්හිදී 16 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ දෙවන අණදෙන නිලධාරීගේ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

නායකත්වය, කණ්ඩායම් හැඟීම, සාරධර්ම සහ සමාජයීය විවිධ පැතිකඩයන් ආවරණය වන පරිදි විවිධ ක්‍රියාකාරකම් සමූහයකින් මෙම වැඩමුළුව සමන්විත විය. එහිදී, කණ්ඩායම් හැඟීම වර්ධනය කරනු ලබන සාමූහික ක්‍රියාකාරකම් මෙන්ම විනෝදජනක අංග රැසක්ද එම දුවා දරුවන් සමග එක්ව සිදුකරනු ලැබූහ. එම වැඩසටහන අවසන් දින අපූර්ව කඳුවුරු ගිනි මැලයක්ද පවත්වා පාසල් භූමිය වර්ණවත් කරමින් නවතමයෙන් පත්කරන ලද ශිෂ්‍ය නායක නායිකාවන්ගේ දක්ෂතා ඔප්නංවමින් දෙදින පුහුණු වැඩමුළුව සාර්ථකව නිමකරන ලදී. ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති හා 14 වන පාබල සේනාංකාධිපති ගේ උපදෙස් හා මඟපෙන්වීම මෙම කටයුත්තේ සාර්ථකත්වය සඳහා නොඅඩුව හිමිවිය.

මූලික යුද උපක්‍රම සංස්කරණ පාඨමාලාවක්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ උපදෙස් මත 65 වන පාබල සේනාංකාධිපති ගේ අධීක්ෂණයෙන් වර්තමාන ක්‍රියාන්විත සූදානම සඳහා පුහුණුවීම්වල අවශ්‍යතාව පාදක කරගනිමින් කොනොනින් සඳහා මූලික යුද උපක්‍රම පිළිබඳ සංස්කරණ පාඨමාලාවක් 65 වන පාබල සේනාංක මූලස්ථානයේදී ඉකුත් ජනවාරි 24 වන දින ආරම්භ කරන ලදී.

මෙම පාඨමාලාවේ කොනොනින් සඳහා සිතියම් කියවීම, මූලික යුද පුහුණුව, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, ලුහු බැඳීම, රැකසිට පහරදීම, නායකත්වය, අවි ආයුධ පුහුණුව, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබාදෙන ලදී. මෙම පාඨමාලාව සඳහා වන්නි බලප්‍රදේශයේ රාජකාරී නියුතු සෑම බළඇණියකින්ම බණ්ඩයක් නියෝජනය වන පරිදි කොනොනින් 45 දෙනකු සහභාගී වූ අතර, පාඨමාලා කාලසීමාව දින 06 කි. මෙම පාඨමාලාවේ ආරම්භක දේශනය 65 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේළ් සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් සිදුකරනු ලැබිය.

සුහදතාවය වර්ධනයට පැසි පන්දු තරඟාවලියක්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ මගපෙන්වීම මත එම බලප්‍රදේශයේ රාජකාරි නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා 62 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීපීයූ ගුණසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී අයිජී ගේ උපදෙස් පරිදි පැසි පන්දු තරඟාවලියක් 2021 දෙසැම්බර් 14, 15 හා 17 යන දිනයන් හිදී ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) පැසි පන්දු ක්‍රීඩා පිටියේදී පැවැත්විණි.

එහි අවසන් මහා තරඟය සඳහා 21 වන පාබල සේනාංක හා 54 වන පාබල සේනාංක පැසි පන්දු කණ්ඩායම් සුදුසුකම් ලැබූ අතර, ඉන් 54 වන පාබල සේනාංක කණ්ඩායම ජයග්‍රහණය කරනු ලැබූහ. මෙම තරඟාවලියේ තෘග ප්‍රදානෝත්සවය පසුගිය දෙසැම්බර් මස 17 වන දින ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත් වූ අතර, මේ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. එහිදී ශූරතාව 54 වන පාබල සේනාංකයටත්, අනුශූරතාව 21 වන පාබල සේනාංකයටත් හිමිවූ අතර, දක්ෂතම පැස විදින්නා ලෙස සෙ/7ටී100346 රෝසෙ ඩිල්ෂාන් එච්ඒඑස් හා දක්ෂතම ක්‍රීඩකයා ලෙස සෙ/516146 මා/සැරයන් අත්තනායක ඒඑම්පීකේ තෘග සහ සහතිකපත් හිමිකරගත්හ.

මූලික යුධ උපක්‍රමික සංස්කරණ පාඨමාලා අංක-02

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ මගපෙන්වීමෙන් හා 65 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒ සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ සෙබළුන්ගේ පුහුණුවීම්වල වැදගත්කම හා අවශ්‍යතාව පාදක කරගනිමින් ආරක්ෂක සේනා (වන්නි) යටතේ පාලනය වන 21, 54, 56, 62 හා 65 වන පාබල සේනාංක යටතේ ඇති සියලුම බලඇණිවල කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා මූලික යුද උපක්‍රම පිළිබඳ සංස්කරණ පාඨමාලාවක් මුලන්කාවිල් බළඇණි පුහුණු පාසලෙහිදී පැවැත්විණ. එහි දෙවන අදියර 2022 ජනවාරි 07 වන දින සිට 2022 ජනවාරි 12 වන දින දක්වා පැවති අතර ඊට කොතොනීන් 90 දෙනකු සහභාගී වූහ.

මෙම පාඨමාලාවේ විෂය පථය සඳහා සිතියම් කියවීම, මූලික යුධ උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, ලුහුබැඳීම, රැකසිට පහරදීම, අවි ආයුධ පුහුණුව, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, මිනිස් අයිතිවාසිකම් හා ප්‍රායෝගික පුහුණුව අන්තර්ගතව ඇත. පාඨමාලාවෙහි අවසන් අවස්ථාව 651 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ඩබ්ලිව් බණ්ඩාර ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පෙබරවාරි 13 වන දින පැවැත්විණ.

කෘෂිකර්ම ව්‍යාපෘති සඳහා වැඩසටහනක්

21 වන පාබල සේනාංකය විසින් සංවිධානය කරන ලද හරිත කෘෂිකර්මය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පසුගිය පෙබරවාරි 02 වන දින එම සේනාංක මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මෙහෙයවූ මෙම වැඩසටහන සඳහා කෘෂිකර්ම ව්‍යාපෘතීන් හි නියැලෙන්නන් 225 දෙනකු සහභාගී වූහ. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සිවිල් නියෝජිතයින් 145 ක් ද, යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් 80 ක් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් 30 දෙනකුද මේ සඳහා සහභාගී වූහ. එමඟින් "හරිත කෘෂිකාර්මික ව්‍යාපෘති" පිළිබඳ දේශන හා "කාබනික පොහොර නිෂ්පාදනය කරන්නේ කෙසේද?" යන්න පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂය ප්‍රවීණයන් විසින් ලබාදෙන ලදී.

මෙම වැඩමුළුවේ ආරම්භක උත්සවය සඳහා 21 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ හා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ජේඑම්ජේකේ ජයසුන්දර මහතා ප්‍රධාන ආරාධිතයින් ලෙස සහභාගී වූහ.

තම්බපණ්ණි සිංහල මහා විද්‍යාලය ජනතා අයිතියට

8 වන විජයබාහු පාබල රෙජිමේන්තු බලප්‍රදේශයේ පිහිටා ඇති කොන්ඩච්චි සිංහල විජයාරාම ගම්මානයට අඩුපාඩුවක්ව පැවති සිංහල පාසලක අවශ්‍යතාව සපුරාලමින් විල්පත්තුව විජයතිලකාරාම විහාරාධිපති මහවිලච්චිය විමල නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් සියලු යටිතල පහසුකම් සහිතව ඉදිකරන ලද තම්බපණ්ණි සිංහල මහා විද්‍යාලය පසුගිය ජනවාරි 30 වන දින ජනතා අයිතියට පත්කරන ලදී.

54 වන පාබල සේනාංකාධිපති ගේ මහපෙන්වීමෙන් 542 වන පාබල බලසේනාධිපති ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත සිදුවිය. එම සේනාංකයේ භටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන්, කෝසල පත්තිනිගේ මහතා සහ "සිසු සෙවණ" සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය මෙම මාහැඟි කටයුත්ත සඳහා ලැබිණ. තවද, මෙම වැඩසටහනට සමගාමීව කොන්ඩච්චි සිංහල විජයාගම කායක්කුලි සහ කොන්ඩච්චි ගම්මානවල පදිංචි තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 160 ක් සඳහා කිඃ ග්‍රෑ: 05 බැගින් සහල් මලු 160 ක්ද ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාව සඳහා ඊනල වැටුණාවේ ඥාණතිකාභිධාන මිරිසවැටියේ විහාරාධිපති හිමි ඇතුළු රාජ්‍ය නිලධාරීන්, ආරක්ෂක අංශ නිලධාරීන් රැසක් සහභාගී වූහ.

නිර්මාණ කුසලතාව සීමිත පිරිසකට පමණක් උරුම වන තත්වයක් නොවේ. එවැනි හැකියා හැම කෙනකු තුළම ප්‍රකාශයට පත්නොවී සැඟව පවතී. ඒවා එළි දැක්වීමට බොහෝදෙනා තුළ ඇති මැළිකම හා පසුබැසීමත්, නිල මානයෙන් හිස් උදුම්මා ගත් ලොකු ලොක්කනුත් නිසා මිනිසුන් තුළ ඇති මේ සුවිශේෂී ශක්තිය අපතේ යයි.

අපතේ යන නිර්මාණ කුසලතා

"අධ්‍යාපන සුදුසුකම් අතින් හෝ පළපුරුද්දෙන් ඔබ කවර තත්වයක රැඳී සිටියත්, වෙළඳසැලක, කර්මාන්තායතනයක හෝ වෙනත් ආයතනයක කෙබඳු අන්දමේ පහළ මට්ටමක රැකියාවක නිරත වුවත්, ඔබම තේරුම් නොගත් තරමේ අගතා අලුත් නිර්මාණශීලී හැඟීම් ඔබේ මොළය තුළ සැඟවී තිබේ" යැයි කෝටිපති හෙන්රි ෆෝර්ඩ් වරක් සඳහන් කළේය.

තම මෝටර් රථ කර්මාන්තායතනයේ සේවක කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මක අලුත් අදහස් හා යෝජනා ප්‍රායෝගික මට්ටමින් සලකා බැලෙන සේවක නිර්මාණ කුසලතා නිරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවමින් එදා හෙන්රි ෆෝර්ඩ් මුල පිරූ එම වැඩපිළිවෙල අද ව්‍යාපාරික ලෝකයම පිළිගත් සිද්ධාන්තයක් වී ඇති අතර, ඒ තුළින් ජීවන මං පෙතේ පහළම හිණි පෙත්තෙන් පටන්ගෙන ඉහළම නැනකට පත්වුණු සාමාන්‍ය ගණයේ පුද්ගලයන් අපමණය.

මේ ක්‍රමය තුළින් තමන් සේවය කරන ආයතනයේ වැඩිදියුණුවට පූර්ණ දායකත්වයක් ලබාදෙන අතරම, ඔවුහු තමන්ගේ පෞද්ගලික සාර්ථකත්වයක් ද දිනාගත්හ.

මනෝ විද්‍යාඥ ස්පෙන්සර් ඩීම් සඳහන් කරන අන්දමට තමන් තුළ නලියන එම නිර්මාණාත්මක අදහස් එළිදැක්වීමට ඒ පිළිබඳව ඉහළ මට්ටමේ වගකිව යුත්තන් සමග කතාබහ කිරීමට දක්වන මැළිකම නිසාම බොහෝ දෙනා සතු මේ කුසලතා උපන් ගෙයිම මිලාන වී යයි.

නුහුරු ඔරොත්තු නොදෙන කාන්තාර භූමි ප්‍රදේශයක, ගල්ෆ් යුද්ධයට මැදිවී අසීරු යුද සේවයක යෙදී සිටි ඇමෙරිකානු හමුදාංකයකට වරක් බලවත් ආහාරපාන හිඟයකට මුහුණපාන්නට සිදුවිය. හිම්දිරියේ තම පසුම්බි තුළ බහාගත් ආහාරපාන හා පානීය ජලය යුද බිමේ ගතකල පැය කීපයකදී අවසන්වී තිබිණි. තාවකාලික කුඩාරමක් තුළට වී ඉතිරිවී තිබුණු ආහාර ස්වල්පය ගත් හටයන් අට දෙනකුගේ කණ්ඩායමක සාමාන්‍ය සෙබළෙක් නිකමට මෙන් තමන්ට පහළ වූ සුළු අදහසක් ඉදිරිපත් කළේය.

"ඇයි නරකද? මේ අපි ආයුධ ආම්පන්න පොන් ගණන් ඇදගෙන එන මේ ට්‍රක් රථවලට දුවන කුස්සියකුත් එක්කර ගත්තොත්" යි ඔහු කීවේය.

නිර්මාණ කුසලතාව සීමිත පිරිසකට පමණක් උරුමවන තත්වයක් නොවේ. එවැනි හැකියා හැම කෙනකු තුළම ප්‍රකාශයට පත්නොවී සැඟව පවතී. ඒවා එළිදැක්වීමට බොහෝදෙනා තුළ ඇති මැළිකම හා පසුබැසීමත්, නිල මානයෙන් හිස් උදුම්මා ගත් ලොකු ලොක්කනුත් නිසා මිනිසුන් තුළ ඇති මේ සුවිශේෂී ශක්තිය අපතේ යයි.

ආයතනයක වත්කම ඩොලර් කෝටි ගණනින් තාක්ෂණික වන කිසියම් දුබලකමක් පිළිබඳව එහි අධ්‍යක්ෂකවරයාට ද වඩා හොඳ අවබෝධයක් නොතිබෙන්නට බැරි නැත. එහෙත්, එතැනම සේවයේ යෙදෙන සේවකයකුට මේ තාක්ෂණික වළක්වා ගතහැකි මඟක් පිළිබඳ අලුත් නිර්මාණාත්මක අදහසක් පහළ විය හැකිය. ඔබ සේවය කරන්නේ කොතැනක වුවත් එවැනි අදහසක් පළ කරන්නට මැළි නොවන්න.

1997 දෙසැම්බර් මහනුවර
කලාපය අඳුරගමි

ඒකාබද්ධ අධ්‍යක්ෂ මණ්ඩල පුනරුත්ථාපන හා සුබසාධන වැඩමුළුව

යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව කැගල්ල දිස්ත්‍රික්කයෙහි ක්‍රියාන්විත හා ක්‍රියාන්විත නොවන වෙනත් හේතූන් මත තුවාල ලබා වෛද්‍ය නිර්දේශ මත විශ්‍රාම ගන්වා ඇති සහ පූර්ණ ආබාධිතව නිවෙස්ගත රණවිරුවන් වෙනුවෙන් පවත්වනු ලබන ඒකාබද්ධ අධ්‍යක්ෂ මණ්ඩල පුනරුත්ථාපන හා සුබසාධන වැඩමුළුව ඉකුත් ජනවාරි 26 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථානයේදී පවත්වන ලදී. එම වැඩමුළුව පිපසම, වැහාලේසම, වෛසේසම, සුසාසම, රණසේවාසම, නීතිසේවාසම, යහසාධකසම, නිවෙහාමාසොසේසම, රණවිරු සෙවණ වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාර නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පැවතිණ. එම අවස්ථාවට පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී, නියෝජ්‍ය පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඩීඒජී සේනාධීර යූඑස්පී සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරීන්ද සහභාගී වූහ.

යාපනයේ දරු දැරියන්ට ඉගෙනුමට අත්වැලක්

51 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පාසල් සිසු දරු දැරියන් 50 දෙනකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ඉකුත් ජනවාරි 09 වන දින පවත්වන ලදී.

යාපනය සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමට රුකුලක් වෙමින්, 10 වන කාලතුවක්කු රෙජිමේන්තුවේ 25 වන සංවත්සර දිනට සමගාමීව අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එන්යූ ලියනාරච්චි අයිජී ඇතුළු ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින් විසින් මෙම ප්‍රජාසත්කාරක වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය ලබාදුන්හ. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී වූ අතර, තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම්, ආසේමු (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රමානි ඇතුළු නිලධාරීන්ද, රාජ්‍ය නිලධාරීන් රැසක්ද ඊට එක්වූහ.

74 වන ජාතික නිදහස් සැමරුම් දිනයට වැඩසටහන් රැසක්

74 වන ජාතික නිදහස් සැමරුම් දිනයට සමගාමීව 20 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් රුක් රෝපණ වැඩසටහනක් දියත් කරන ලදී. තවද, ඒකක අණදෙන නිලධාරී ගේ ආරාධනයෙන් 662 වන පාබල බලසේනාධිපති ගේ ප්‍රධානත්වයෙන් එම බලප්‍රදේශයේ දිළිඳු පවුල් දෙකක ආබාධිත දරුවන් දෙදෙනකු සඳහා රෝදපුටු බෙදා දීමේ සත්කාරයක්ද සිදුකරන ලදී.

විවාහය වහකදුරු කර නොගන්න

> යමකු කසාද බන්ධනයට ඇතුළත් වන්නේ අනෙකාගේ වත් පොහොසත්කම් දෑවැද්ද භුක්ති විඳීමට සිතාගෙනය. තමන්ගේ හුදෙකලා බව නිවා ගැන්මටය. නැතිනම් මවගෙන් හෝ පියාගෙන් ගැලවීමටය. ඒ අතරම, හඳිසියේ පිහිටන දරු ගැබකට වෙනත් විකල්ප පිළිතුරක් නැති නිසා කසාද බඳින්නෝ ද සිටිති. බැඳිය යුතු නිසා බඳින තවත් සමහරකු ද සිටින බව අප දනිමු. සහකරුවා හෝ සහකාරිය ගැන ඇතිවන අනුකම්පාව නිසා ඇති වන විවාහ ද තිබේ. පෞද්ගලික හෝ පවුල් වෛරයක් පිරිමසා ගැනීමට කසාද බඳින්නන් පිළිබඳව වාර්තා නොවනවා නොවේ.

යුග දිවියට එළැඹීමට දෙදෙනකු අතිනත ගන්නේ දෙවියන්ගේ කැමැත්ත මතය යන්න සමහරකුගේ විශ්වාසයකි. එහි ඇත්ත නැත්ත කුමක් වුවත් විවාහය නම් දිව්‍ය විමනක් නොවන බව ඇත්තකි. පනින්නට පෙර සිතා බැලිය යුතුය යන කියමන විවාහ වීමට කලින් සිහියට නඟාගත යුතු අවවාදයක් වන්නේ එහෙයිනි.

විවාහය පිළිබඳව පවතින පොදු සමාජ ආකල්පයන්ගෙන් කියැවෙන්නේ එකිනෙකාට ඇති ආලය නිසාත්, ජීවිතයට සතුට ළඟාකර ගැනීම සඳහාත්, කිසිදා නොබිඳෙන සම්බන්ධතාවක් තහවුරු කර ගැනීම සඳහාත්, අප විවාහයට එළඹෙන බවයි. එහෙත්, අවාසනාව නම් ප්‍රායෝගික ලෝකය තුළ මේ ආකල්ප සෑම විටම මල්ඵල ගන්නේ නැතිකමය. යමෙකු කසාද බන්ධනයට ඇතුළත් වන්නේ අනෙකාගේ වත්පොහොසත්කම් දෑවැද්ද භුක්ති විඳීමට සිතාගෙනය. තමන්ගේ හුදෙකලා බව නිවා ගැන්මටය. නැතිනම් මවගෙන් හෝ පියාගෙන් ගැලවීමටය. ඒ අතරම, හඳිසියේ පිහිටන දරු ගැබකට වෙනත් විකල්ප පිළිතුරක් නැති නිසා කසාද බඳින්නෝ ද සිටිති. බැඳිය යුතු නිසා බඳින තවත් සමහරකු ද සිටින බව අප දනිමු. සහකරුවා හෝ සහකාරිය ගැන ඇතිවන අනුකම්පාව නිසා ඇති වන විවාහ ද තිබේ. පෞද්ගලික හෝ පවුල් වෛරයක් පිරිමසා ගැනීමට කසාද බඳින්නන් පිළිබඳව වාර්තා නොවනවා නොවේ.

විවාහයක් ගැන අදහසක් ඔබ සිත තුළ තිබේ නම් මා විවාහ දිවියට එළඹෙන්නේ මක් නිසාදැයි ඔබෙන්ම විමසාලීම වැදගත්ය. ඒ ඔබ දරන අදහස් ඔබේ යුග දිවියට සෘජුවම බලපාන නිසාය. එම හේතු පිළිබඳව සලකා බැලීම හැරෙන්න විමසා බැලිය යුතු තවත් කරුණු අතලොස්සක් තිබේ.

ඔබේ දෙමාපියන්ගේ විවාහය සතුටුදායක වූවක්ද...? ඒ පිළිබඳව කල්පනා කළ යුත්තේ එය ඔබේ විවාහයට බලපෑමක් ඇති කරන නිසා නොවේ. විවාහය යන වචනය ඔබට හඳුන්වා දුන්නේ ඔවුන් නිසාය. ඔවුන් දෙදෙනාගේ ආශිර්වාදය ඔබේ විවාහයට ලැබීමද වැදගත්ය. එයට ඔවුන්ගේ එකඟත්වයක් නොමැතිනම් එය ලබාගැනීමට උනන්දු වන්න. ඔවුන්ගේ අනුමැතිය ඔබේ විවාහය ශක්තිමත් කිරීමට දායක වන්නකි.

ඔහු අතිනත ගන්නේ කවර කාලයක සිට ඔබ හඳුනන සහකරුවකු සමගද? ඇස ගැසුණු පළමු දිනයේම ඔබ දෙදෙනා පෙමින් බැඳුණාද? එය වඩාත් සතුටුදායකය. එහෙත් ඇති තරම් සතුටුදායක නොවේ. විවාහයක් ස්ථිරසාර වන්නේ දෙදෙනා අතර පවතින අන්‍යෝන්‍ය හැඳුනුම්කමේ පුළුල් බව මතය.

එකිනෙකාගේ ආශාවන් හා බැඳීම් යටපත් කොට ගැනීම, සංවාදයට ලක් කිරීමෙන් වැළකීම නුවණට හුරු නොවේ. ඔබ කැමති අකමැති දෑ, ඇය කැමති අකමැති දෑ, ඇයගේ ආගමික ලැදියාවන්, ඔබගේ ආගමික ලැදියාවන්, දෙදෙනාගේ දෙමාපියන්, අනාගත බලාපොරොත්තු ආදී මේ සෑම දෙයක් සංවාදයට බඳුන් කළ යුතුමය.

මේ සියල්ල විසඳාගත් පසු කළ යුතු තවත් වැදගත් අදහස් හුවමාරුවක් තිබේ. දෙදෙනා අතර, අපහසුතාවක් පැන නොනගින සේ අවතීර්ණ විය යුතු මෙම මාතෘකාව වන්නේ ලිංගික වර්යාවය. දෙමාපියන් විසින් සංවිධානය කළ විවාහයක් නම් මෙවන් අංශයක් සාකච්ඡාවට ලක්කිරීමට තරම් හැඳුනුම්කමක් ගොඩනැගීමට කාලය බාධාවක් විය හැකිය. එවන් තත්වයකට මැදිවීමට සිදුවුවහොත් කළ යුත්තේ දෙදෙනාට එකිනෙකා හා සාමීචියක යෙදීමට හැකි ඉඩකඩක් දෙමාපියන් ලවාම සකසා ගැනීමය. මේ අන්‍යෝන්‍ය හඳුනාගැනීම විවාහයේ සාර්ථකත්වයට

විවාහයක් ගැන අදහසක් ඔබ සිත තුළ තිබේ නම් මා විවාහ දිවියට එළඹෙන්නේ මක් නිසාදැයි ඔබෙන්ම විමසාලීම වැදගත්ය. ඒ ඔබ දරන අදහස් ඔබේ යුග දිවියට සෘජුවම බලපාන නිසාය

ඉතාමත් ඉවහල් වන කරුණක් නිසා සැහීමකට පත්විය හැකි තරමකට එය වර්ධනය වන තෙක් විවාහ දිනය හෝ කල්දමා ගැනීම යෝග්‍යය.

1998 මාර්තු මාසයේ අනුරාධි.

එතෙර දිනූ සිසුවියට හරසර පිදේ

කරිපඩඩමුරිප්පු රජයේ දෙමළ මිශ්‍ර පාසලෙහි ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් වන ගනේෂ් ඉන්ද්‍රිකාදේවි විසින් පාකිස්තානයේ ලාහෝර් නුවරදී ඉකුත් ජනවාරි 13 වන දින සිට 19 වන දින දක්වා පැවති ජාත්‍යන්තර කික් බොක්සින් තරගාවලියට සහභාගී වී රන් පදක්කමක් ලබා ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් අත්කරදෙන ලදී. ඒ නිමිත්තෙන් ඇය හට උපහාර ලෙස රථ පෙළපාලියක් සහ පිළිගැනීමේ උත්සවයක් එම විද්‍යාලයේදී පසුගිය පෙබරවාරි 01 වන දින පැවැත්විණ. 59 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබංඩාර යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සහ ආසේමු (මූලනිව) බ්‍රිගේඩියර් ප්‍රමානි බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සහභාගීත්වයෙන් එය කරිපඩඩමුරිප්පු පාසලේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලැබූහ. එහි සංවිධාන කටයුතු 642 වන පාබල බලසේනාධිපති කර්නල් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය මත 23 වන බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සිදුකරන ලදී.

අක්ෂි සායනයක්

57 වන පාබල සේනාංකාධිපතිගේ මඟපෙන්වීම යටතේ 571 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජීසීඑම්එච් ගමිලත් ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් එම බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉකුත් ජනවාරි මස 22 වන දින අක්ෂි සායනයක් පවත්වන ලදී. පහසුකම් මධ්‍යස්ථානය - කිලිනොච්චි හිදී පැවති මෙම වැඩසටහන සඳහා 571 වන පාබල බලසේනාධිපති ගේ සෘජු මැදිහත්වීම යටතේ කොමර්ෂල් බැංකුවේ විධායක නිලධාරී ඉන්දික තිලකහේවා හා කනිෂ්ඨ විධායක නිලධාරී මොහාන් සමරතුංග යන මහත්වරු සමඟ කොමර්ෂල් බැංකුව හා අනුරාධපුර මයිවිෂන් ආයතනය සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලැබූහ. ඒ අනුව 7 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 9 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලප්‍රදේශයන්හි ජීවත්වන සාමාන්‍ය ජනතාව 165 දෙනකු ඊට සහභාගී වූහ.

කණ්ඩායම් ගොඩනැගීම හා නායකත්ව පුහුණු වැඩසටහනක්

59 වන පාබල සේනාංක බළඇණි පුහුණු පාසලේ බළඇණි පුහුණුවීම්වල නිරත 5 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිලයින් ගේ පුද්ගලික හැකියාවන් දියුණු කිරීමේ අරමුණින් කණ්ඩායම් ගොඩනැගීම හා නායකත්ව පුහුණු වැඩසටහනක් ඉකුත් ජනවාරි 23 වන දින පවත්වන ලදී.

ඉගෙනුමට විරු සවියක්

කරිපඩ්ඩමුරුප්පු හා තණ්ඩුවාන් රජයේ දමිළ පාසල්වල ඉගෙනුම ලබන ළමුන් 94 දෙනකු සඳහා පාසල් පාවහන් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 20 වන දින 642 වන පාබල බලසේනාධිපති කර්නල් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

ළදරු උපකරණ බෙදාදීමේ වැඩසටහනක්

11 වන (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් ගැමුණුපුර ග්‍රාමසේවා වසමේ ජීවත්වන සිවිල් ජනතාව අතුරින් තෝරාගත් අඩුආදායම්ලාභී පවුල්වල ගැබිණි මව්වරුන් 60 දෙනකු සඳහා රුපියල් 10,000 /- ක් බැගින් වටිනා ළදරු උපකරණ මලු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය පෙබරවාරි 02 වන දින මංගලගම ශ්‍රී ධර්මාරාම විහාරස්ථානයේදී පැවැත්විණ.

මේ සඳහා ආසේමු (නැගෙනහිර) ආදායපති, 12 වන පාබල සේනාංකාධිපති, 11 වන (සෙව්) ශ්‍රීලංසිරෙ අණදෙන නිලධාරි ඇතුළු පිරිසක් සහභාගී වූහ. මනෝවිද්‍යා දේශක දුලන්ජි චමල්කා මෙනෙවිය මෙම ප්‍රජාසත්කාරය සඳහා මූල්‍ය අනුග්‍රහය සපයනු ලැබුවාය.

විරු දිරියෙන් හිසට සෙවණක්

562 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සම්බන්ධීකරණයෙන් හා අධීක්ෂණයෙන් වව්නියාව සේෆ්ටි ක්‍රෙඩිට් සහ සේෆ්ටි ගන්කෙයා පුද්ගලික ආයතනයේ අධ්‍යක්ෂ මහේන්ද්‍රරාජා මයුරතන් මහත්මාගේ මූල්‍ය දායකත්වය මත වව්නියාව 244 ආසිකුලම් ග්‍රාමසේවා වසමේ අඩුආදායම්ලාභී පවුලක් වන මොහන්රාජ් මහේශ්වරි මහත්මිය හට නිවසක් ඉදිකර පරිත්‍යාග කිරීම පසුගිය ජනවාරි 14 වන දින සිදුකෙරිණ. මෙහි ඉදිකිරීම් සඳහා 17 වන (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ශ්‍රමදායකත්වය සපයනු ලැබූහ.

රෝදපුටු පරිත්‍යාගයක්

53 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත හිතවතකු මාර්ගයෙන් ලබාදී තිබූ රෝදපුටු පරිත්‍යාගයක් මකුළුගස් වැව ග්‍රාමයට අයත් දේවහූව ප්‍රාථමික රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩලය වෙත රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කිරීම එම සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරි විසින් ඉකුත් ජනවාරි 07 වන දින සිදුකරන ලදී.

ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක ඒකක සංචාරයක

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේඩීසීජී ජයසිංහ කේඑස්පී කේඑස්වී ඉකුත් ජනවාරි 16 වන දින 5 (සෙව්) ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය.

11 වන සේනාංකයේ 12 වන සැමරුම

11 වන පාබල සේනාංක මූලස්ථානයේ 12 වන සංවත්සර දිනය 2022 පෙබරවාරි මස 15 වන දිනට යෙදී තිබුණි. රට සමගාමීව සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ආගමික කටයුතුවලට මුල්තැන දෙමින් වැඩසටහන් මාලාවක් සිදුකරන ලදී. මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාළිගාවේ කිරි ආහාර පූජාවෙන් ඇරඹී එම වැඩසටහන් අතර, සේනාංකාධිපති වෙනුවෙන් 10 වන ගජබා රෙජිමේන්තු ඒකකයේ හටපිරිස්හි සහභාගීත්වයෙන් පැවති කඳවුරු සම්මාන මුරය, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, සේනාංක මූලස්ථාන ක්‍රීඩාංගණයේ පැවති සංගීත ප්‍රසංගය ප්‍රධාන විය. සංවත්සරය නිමිත්තෙන් වූ එකී වැඩසටහන් සඳහා එම සේනාංකයට අයත් සියලු නිලයෝ එකාවන්ව රොක්වූහ.

මුල් ළමාවිය සංවර්ධනයට අනුගත

1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ 70 වන සංවත්සරයට සමගාමීව එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ඉකුත් ජනවාරි 01 වන දින 1 ශ්‍රීලයුපොදුසේබ අනුබණ්ඩය කන්තලේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදී එම අනුබණ්ඩයේ ග්‍රමදායකත්වයෙන් ඉදිකළ "සමනල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය" හි ඉගෙනුම ලබන දූ දරුවන් 32 ක් වෙනුවෙන් පාසල් උපකරණ, සනීපාරක්ෂක ද්‍රව්‍ය මෙන්ම පෙර පාසල සඳහා අවශ්‍යව පැවති සිවිලිං විදුලි පංකා පරිත්‍යාග කිරීමද දිවා ආහාර වේලක් ලබාදීමද සිදුකෙරිණි. එම සත්කාරය සඳහා මූල්‍ය අනුග්‍රහය කොළඹ සෙන්ටේනියල් සිංහ සමාජය විසින් සිදුකරන ලදී.

විරු දරියෙන් නව සෙවණක්

වව්නියාව 214 ජී, මුණ්ණිමුරුප්පු ග්‍රාමසේවා වසමේ අඩු ආදායම්ලාභී පවුලක් වන ඩී. දීපිකා සංජීවනී මහත්මිය හට පසුගියදා නව නිවසක් පරිත්‍යාග කෙරිණ. 562 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය යටතේ මහජන බැංකු බෞද්ධ සංගමය ඊට මූල්‍ය දායකත්වය දරන ලදී. නිවස ඉදිකිරීම සඳහා 17 වන (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් ශ්‍රමදායකත්වය සැපයූහ.

අකුරු කරනට රණවිරු අත්වැලක්

ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ පාලනය වන 682 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ඇති පාසල් සඳහා ක්‍රීඩා භාණ්ඩ හා වවුචර් පත් ප්‍රදානය කිරීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ගේ මගපෙන්වීම මත 682 වන පාබල බලසේනා මූලස්ථාන දේශන ශාලාවේදී පසුගිය පෙබරවාරි 08 වන දින පැවැත්විණ. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ආරාධිතයින් ලෙස 68 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේආර්කේකේටී බන්ඩාර ආර්එස්පී යූඑස්පී, 682 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී, 681 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එන්ඩීපී ගුණතුංග, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (මුලතිව්) පී තමිල්මාරන් මහතා, *JSBCLLC* ඩුබායි සමාගමෙහි හා ෆිටිනස් ප්ලේස් ආයතනය මාතලේ හි අධිපති ආර්ජී ප්‍රජලිත පුෂ්පකුමාර යන මහත්වරු සහභාගී වූහ.

මෙම ක්‍රීඩා භාණ්ඩ ලබාදීම සඳහා අනුග්‍රහය *JSBCLLC* ඩුබායි සමාගමෙහි හා ෆිටිනස් ප්ලේස් ආයතනය මාතලේ හි අධිපති විසින් ලබාදෙන ලදී. මෙම අවස්ථාවට පැමිණ සිටි සියලුම ගුරු මහත්ම මහත්මීන් සඳහා සින්දු මල්ටි සිලෙක්ෂන් ආයතනය, පුදුකුඩුරිප්පු වෙතින් පාසලට අවශ්‍ය භාණ්ඩ ලබාගැනීමට රුපියල් 3000.00 ක වටිනාමකින් යුත් තෑගි වවුචරය බැගින් ලබාදීමද විශේෂත්වයකි.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඇරඹේ

සංඥා පාසල මගින් දැනට පවත්වන පාඨමාලා විෂය මාලාව සමාලෝචනය කරමින් "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉදිරි උපාය මාර්ගික සැලැස්ම 2020 - 2025" ට අනුකූලව ජාතික වෘත්තිය පුහුණු සුදුසුතා පස්වන මට්ටමින් යුත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමාවක් තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සහයෝගිතාවයෙන් හඳුන්වාදීම සිදුකරන ලදී. යුද්ධ හමුදා පුහුණු අණසක සහ යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය මත ආරම්භ කරන ලද මෙම ප්‍රථම තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ සමාරම්භක උළෙල පසුගිය පෙබරවාරි මස 07 වන දින සංඥා පුහුණු පාසලේදී පවත්වන ලදි.

ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයූ ගේ සහභාගීත්වයෙන් පැවති එම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති ඉංජිනේරු උදේනි වික්‍රමසිංහ මහතා සහභාගී විය.

"ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉදිරි උපාය මාර්ගික සැලැස්ම 2020 - 2025" ට සමගාමීව අනාගත යුද්ධ හමුදාවේ අභියෝග සහ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන

තාක්ෂණයේ වෘත්තිකයින් වශයෙන් එලදායී ලෙස සේවයේ යෙදවීම සඳහා නිලධාරීන් සහ සෙසු නිලයින් අනුයුක්ත කිරීමේදී ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වාදෙන ලදී. මාස හයකින් යුත් පාඨමාලා කාලසීමාව තුළ තාක්ෂණික මෙන්ම සේවා නියුක්තිය තුළදී වැදගත් වන විෂයන් පිළිබඳවද පුළුල් දැනුමක් මෙම පාඨමාලාව හැදෑරීම තුළින් ලබාදෙනු ලැබේ.

ENGLISH Vision...

English Vision පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන නවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු

May as well

ආවේගශීලී ප්‍රකාශයක් කිරීමේදී "කරපුදෙන්" ආදී වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී බහුලව භාවිතවන වාක්‍යය රටාවකි.

Fomular :- සූත්‍රය

Subject +May as well+ Verb + Object + Rest.
සබ්ජෙක්ට් +මේ ඇස් වෙල් + වර්බ් +ඔබ්ජෙක්ට්+රෙස්ට්.
කර්තෘ + කරපුදෙන් + ක්‍රියාපදය+ කර්මය+ ඉතිරිය.

Ex / උදා :-

1. She may as well cry.
   ෂී මේ ඇස් වෙල් ක්‍රයි.
   ඇය ඔහේ අඩපුවාවේ/අඩපුදෙන්.

2. He may as well blame.
   හී මේ ඇස් වෙල් බ්ලේම්.
   ඔහු ඔහේ බැනපුවාවේ/බැනපුදෙන්.

3. Children may as well play in the evening.
   චිල්ඩ්‍රන් මේ ඇස් වෙල් ප්ලේ ඉන් ද ඊවිනින්ග්.
   ළමයි හවස සෙල්ලම් කරපුදෙන්.

Nota Bene / සැ.යු :-

ඉහත වාක්‍යය පිළිබඳ සැලකීමේදී පහත පෙන්වා ඇති ව්‍යාකරණ රීතීන්ට අනුව වාක්‍යය සැකසිය හැකියි.

- **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමඟ ව්‍යාකරණානුකූලව භාවිත වේ.

- **May as well :-** "කරපුදෙන්" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිත වේ.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිත කිරීමේදී ක්‍රියා මූල පදයක් ලෙස භාවිත කළ යුතුය.

- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන, පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිත වේ.

- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිත වේ.

Analysis of the sentence formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

Subject +May as well+ Verb + Object + Rest.
සබ්ජෙක්ට්+මේ ඇස් වෙල් + වර්බ් +ඔබ්ජෙක්ට්+රෙස්ට්.
කර්තෘ + කරපුදෙන් + ක්‍රියාපදය+ කර්මය+ ඉතිරිය.

She may as well cry.
ෂී මේ ඇස් වෙල් ක්‍රයි.
ඇය ඔහේ අඩපුවාවේ.

"English vision" නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මිළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

තපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලුසොලුසේබ
ජනමධ්‍ය අම - ගුනමු
www.englishvision.lk

අනියම් සබඳතා...

ගතට සැපයකි
සිතට ගින්නකි
සහකරුට සහකාරියට කඳුළකි
දරුවන්ට නිගාවකි
කුලගෙයට කටු ඔටුන්නකි
සැනසුමට මරු පහරකි
එබැවින් සිතන්න
ආශාවකට වහල් වී
දැන දැන ගිනි ගෙට නොගන්න
සොදුරු කැදැල්ල
අඳුරු නොකර ගන්න...

සෙ/8සිසු00650
මා/සැරයන් ප්‍රේමසිරි එස්එම්අයිජේ
8 ශ්‍රීලංකාබමු

මවකගේ ගුණ...

නිදි වරා නෙතු අයා
බලා ඉමි රෑ පුරා
නුඹ සුවඳ යළි දිනක
ළඟට මා එනතුරා

විඩාබර වූ මසිත
මවයි නෙක රෑ රටා
නොමැති නුඹ ගේ පුරා
ඉකි ගෙයි බුර බුරා

පෙර කරපු පාපයක්
පසු පසම ලුහු බැඳන්
පැතුම් සැම සුන් කරන්
මගේ සතුට දුර ගිහින්...

සෙ/3ආර්01558
කෝප්‍රල් සමරවීර එම්ජේ
3(සෙව්) ශ්‍රීලංකාබ

සෙබළ අභිමන...

මඩ වලක් වෙහෙසිලා
සරබ භූමිය කළා
මුරයෙ හැම සීරුවෙන්
ඔන්න දැන් අණ දෙනා

කැමරාද සීරුවෙන්
රතට පාවඩ එලා
පොද වැස්සෙ තෙම් තෙමී
කුඩ පාවි හැඩ දමා

සුබ නිමිති අතුරලා
ඉන්න තැන ඔපකළා
පැමිණි හැම සතුරිනා
ආචාර පුද කළා

රාජකාරියමයි දේවකාරිය
එයම මොනවට කියාපානා
මෙයයි සොල්දාදුවගෙ අභිමන
එක්ව යන අරමුණ කරා...

කපිතාන් දිල්හාරා දිසානායක
ජාඹ

යහතින් හිඳින්...

සිරිනා කොදෙව්වක
නුඹ සැප විඳින
මවෙතින් ලැබුණු
ආදරයක් ලැබේ නම්
මතකය නුඹට
හිරිහැරයක් නොවේ නම්
තව කුමකටද
දුක් ගී කල්පනාවක්...

සෙ/372941
සැරයන් චන්ද්‍රසේන ඒඒපීඑන්
16 ශ්‍රීලංසිරෙ - (අභිමංසල 3)

මගේ පැතුම නුඹ...

සංසාරෙන් සංසාරෙට
ඔබේ නමින් පැමිණිය
මගේ පැතුම නුඹ
රැක ගන්නම් දිවි ඇති තුරු
ආදරයෙන්...

සෙ/471639
සැරයන් රංජිත් බංඩාර ඩීඑම්
14 ගරෙ - (අභිමංසල 3)

පුංචි දෝණි...

පුංචි දෝණියේ මගෙ එපා හැඩන්න
ඇසේ කඳුළු සඟවා ගෙන නාඩා හිඳින්න
ලස්සන ලෝකයක් කරා පා ඔසවන්න
කරපු කරුම තව තියනව ගෙවා දමන්න

අම්මා තාත්තා දෙන්නම මමයි කියා
අම්මා දිල ගිය තැග්ගකි ඔයා
ඔබේ කඳුළු මගේ සිතින් දමයි ගිනි තියා
පුංචි දෝණියේ තාඩන් මමයි නුඹේ පියා

සෙ/471445
සැරයන් සත්කුමාර එච්ඒවීඑන්

දෝණි...

පණ මෙන් ආදරේ - මුතු ඇට සාගරේ
වෙන කොනෙකුට නම් නොවේ
නුඹටයි මගෙ දුවේ
අද සිට මගේ ලොවේ
සතුටයි ඉතුරුවේ
නැත මට කරදරේ
ඒකයි හිනැහුණේ
දෝතට ගත් දිනේ
මගෙ ගත වෙව්ලුවේ
දෙවියනි රැක දෙන්න ඔබ මගේ
දෝණිව සෑම දිනේ...

සෙ/328402
ලා/කෝ චන්ද්‍රසේකර එල්එස්
12 ශ්‍රීලපාහ

පහන් වූ සිත...

අවිදු අඳුර දුරු කර
දස ඇකුසලයෙන් මිදී
දහම් සයුරේ කිමිදෙන්නේ
බුදු හිමියනි ඔබේ ගුණ හිත්දයි
පහන් සිතින් බුදු හිමි ගුණ
ලියනෙමි මම ඇකුරෙන් ඇකුර මුමුණ මුමුණා
සැනසුම සම්පත සොම්නස
ලැබගමි මම බුදු දහම තුළින්
වීර විකුම හිමිගෙ ශ්‍රී පාද වඳිමි
සුවඳ මලින්...

සෙ/2ඩී03197
ලා/කෝ දයාරත්න ඩීඒටී
2 ශ්‍රීලපාහ

ප්ලේන් ක්‍රෑෂ් එක...

දරුණු ගුවන් අනතුරකට පසු ඉතා පුදුම සහගත අන්දමින් දිවි ගලවා ගැනීමට හැකිව තිබුණේ එහි ගමන් කළ එක්තරා වඳුරකුට පමණි. සිද්ධිය වූ ස්ථානයට කඩිමුඩියේ කඩා වැටුණු මාධ්‍යය කණ්ඩායම වඳුරාව ඉන්ටර්වියු කරන්නට විය.

මාධ්‍ය : සිද්ධිය වෙන්න ටික වේලාවකට කලින් ප්ලේන් එකේ ගමන් කළ මගීන් හිටියේ මොනවා කර කරද?

වඳුරා : ඒගොල්ලෝ ඉතිං කකා බීබී හිටියා.

මාධ්‍ය : එතකොට ගුවන් සේවිකාවෝ.

වඳුරා : ඒගොල්ලෝ මිනිස්සුන්ට කෑම බීම අල්ල අල්ල හිටියා.

මාධ්‍ය : එතකොට පයිලට්ලා.

වඳුරා : ඒගොල්ලෝ තමයි කොක්පිට් එකට වෙලා ප්ලේන් එක හැන්ඩිල් කර කර හිටියේ.

මාධ්‍ය : එතකොට උබ හිටියේ.

වඳුරා : මං ඉතිං එහෙට මෙහෙට පැන පැන හිටියා.

මාධ්‍ය : එතකොට සිද්ධිය වෙන්න ඔන්න මෙන්න වගේ තියෙද්දි මගීන් හිටියේ මොනවා කර කරද.

වඳුරා : ඒගොල්ලෝ හිටියේ නිදාගෙන.

මාධ්‍ය : එතකොට ගුවන් සේවිකාවෝ.

වඳුරා ඒගොල්ලෝ පයිලට්ලා එක්ක මුකුළු කර කර සිටියේ.

මාධ්‍ය : එතකොට පයිලට්ලා.

වඳුරා : ඒගොල්ලෝ ගුවන් සේවිකාවන්ව හැන්ඩිල් කර කර හිටියේ.

මාධ්‍ය : එතකොට උබ?

වඳුරා : මම තමයි කොක්පිට් එකට වෙලා ප්ලේන් එක හැන්ඩිල් කර කර හිටියේ.

සැමියාගේ වියෝව...

තම සැමියා මෑතකදී හදිසි අනතුරකින් මිය ගිය කිරිඳක් අස්වැසීමට පැමිණි සමාජ සේවිකාවක් ඉතා ලෙන්ගතුව එම අනතුර ගැන විමසීය. ඒක බලාපොරොත්තු නොවිච්ච අනතුරක්. එදා එයා රෑට කන්න පාන් ගෙඩියක් ගේන්න ගියා. ටික වෙලාවකින් පහළ ගෙදර සුමනසිරි ඇවිල්ලා කිව්වා එයා බස් එකකට යට වෙලා එතනම මැරුණා කියලා.

සමාජ සේවිකාව : ඉතින් ඔයා මොකද කලේ?

මම මොනවා කරන්නද මම රෑට නූඩ්ලස් කෑවා.

කුඩාම නගරය...

ටීචර් : සිරිපාල කියනවා බලන්න ලංකාවේ කුඩාම නගරය මොකක්ද කියලා?

සිරිපාල : අම්බලන්ගොඩ.... ටීචර්.

ටීචර් : ඈ.... එහෙම කොහොමද වෙන්නේ?

සිරිපාල : ඇයි ටීචර්....
"ආයුබෝවන් අම්බලන්ගොඩ" කියලා ලියපු බෝඩ් එකේම අනික් පැත්තේ ලියලා තියෙනවා "ස්තූතියි. නැවත එන්න" කියලා.

දීග කන්නේ...

කමල් : ඉතිං මචං... මට කියපන්කො මොකද උබ අර කෙල්ලට බූට් එක තිබ්බෙ කියලා?

රුවන් : අපෝ මතක් කරන්න එපා මචං... මම දවසක් එයාව හම්බ වෙන්න බෝඩිමට ගියා. මම ගිහිල්ලා දොරට තට්ටු කළාම එයා කලබල වෙලා වගේ දොර ඇරියා. විශ්වාස කරපං මචං. මට බොන්න මොනව හරි හදන් එන්නං කියලා එයා ගේ ඇතුළට ගිය වෙලාවෙයි දැක්කෙ. සාලේ තිබුන ඇෂ් ට්‍රේ එකේ බීලා ඉවර කරපු සිගරට් කොට 3 ක් තිබ්බ. ඒ වෙනකොටත් එකක් පත්තු වෙච් තිබුණෙ.

කමල් : උබ ඒ කෙල්ලව අත්ඇරපු එක හොඳයි මචං.

රුවන් : ඔව් මචං උබ පොඩ්ඩක් හිතලා බලපං. මම කොහොමද සිගරට් බොන කෙල්ලෙක් එක්ක දීග කන්නෙ.

වෘත්තීය දිවියේ අනේකවිධ කඩ ඉම් පසු කොට
සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට
දිරිය, විරිය, රැකවරණය ලැබේවායි
"රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.

ඉඳිරි නඩත්තු පෙදෙස
(උතුර/නැගෙනහිර) ආඥාපති ලෙස

මේජර් ජෙනරාල්
එම්ජපි වීරසිංහ යූඑස්පී එෆ්ඩී

2022 ජනවාරි මස 21 දින සිට

ශ්‍රී ලංකා යුද හමුදා
ස්වේච්ඡා බලසේනා
නියෝජ්‍ය සේනාධිධායක ලෙස

මේජර් ජෙනරාල්
එස්එන් සමරවික්‍රම කේඑස්පී

2022 පෙබරවාරි මස 21 දින සිට

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු
අධ්‍යක්ෂ ලෙස

බ්‍රිගේඩියර්
ජේඒආර්එස්කේ ජයසේකර යූඑස්පී
පීඑස්සී

2022 පෙබරවාරි මස 23 දින සිට

ආරක්ෂක සේනා
මූලස්ථානය (මූලනිව්)
බ්‍රිගේඩියර් (පාලන/භාණ්ඩ) ලෙස

බ්‍රිගේඩියර්
සීඑස් දිසානායක එෆ්ඩී

2022 ජනවාරි මස 24 දින සිට

ගමන් පාලන අධ්‍යක්ෂ ලෙස

බ්‍රිගේඩියර්
කේඑල්එස්එස් ලියනගම
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

2021 දෙසැම්බර් මස 17 දින සිට

පුනරුත්ථාපන අධ්‍යක්ෂ ලෙස

බ්‍රිගේඩියර්
එස්සී ඒසහායක ආර්එස්පී
2022 පෙබරවාරි මස 07 දින සිට

ඉඩම්, දේපල සහ භට නිවාස
අධ්‍යක්ෂ ලෙස

බ්‍රිගේඩියර්
ඩීආර්එත් හෙට්ටිආරච්චි
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී

2022 පෙබරවාරි මස 07 දින සිට

ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ
මධ්‍යස්ථාන සේනාධිධායක ලෙස

බ්‍රිගේඩියර්
ඊඩීකේ එදිරසිංහ
2022 පෙබරවාරි මස 15 දින සිට

612 වන පාබල බලසේනාධිපති
ලෙස

බ්‍රිගේඩියර්
එල්ජබී කාර්යවසම්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
2022 පෙබරවාරි මස 17 දින සිට

ආරක්ෂක සේනා
මූලස්ථානය (මධ්‍යම)
බ්‍රිගේඩියර් (පාලන/භාණ්ඩ) ලෙස

කර්නල්
එන්ඒඑස්එන් හානුමිආරච්චි

2022 ජනවාරි මස 20 දින සිට

681 වන පාබල බලසේනාධිපති
ලෙස

කර්නල්
එන්ඩීපී ගුණතුංග

2022 පෙබරවාරි මස 03 දින සිට

කමාන්ඩෝ රෙජිමේන්තු
මධ්‍යස්ථානයේ කාර්ය නියුතු
මධ්‍යස්ථාන සේනාධිධායක ලෙස

කර්නල්
බීඑම්එස්කේයේ ධර්මවර්ධන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී

2022 ජනවාරි මස 25 දින සිට

513 වන පාබල බලසේනාධිපති ලෙස

කර්නල්
එම්ආර් රාසික් ආර්එස්පී
2022 පෙබරවාරි මස 17 දින සිට

ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් ගමන් පාලන ලෙස

කර්නල්
ජේඑම්ඒ ජයසේකර ආර්එස්පී යූඑස්පී
2021 නොවැම්බර් මස 22 දින සිට

යුද්ධ හමුදා ගාරිරික අභ්‍යාස පුහුණු පාසලේ සේනාධ්‍යක්ෂ ලෙස

කර්නල්
කේඒඩබ්ලියූ කන්නන්නර ආර්එස්පී
2022 පෙබරවාරි මස 10 දින සිට

සටන් පුහුණු පාසල - අම්පාර හි අණදෙන නිලධාරි ලෙස

කර්නල්
ඒකේඩීඑස් ද සිල්වා ආර්එස්පී
2022 පෙබරවාරි මස 17 දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කර්නල් ප්‍රමානි ලෙස

කර්නල්
ඩබ්ලිවිකේඑස්පීඑම්ආර්ඒඩී දොඩම්වෙල පීඑස්සී
2022 පෙබරවාරි මස 03 දින සිට

විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් විනයාරක්ෂක ලෙස

කර්නල්
ජේඑස් මුණසිංහ
2022 ජනවාරි මස 31 දින සිට

52 වන පාබල සේනාංකයේ කර්නල් (පාලන/ගකාස) ලෙස

කර්නල්
ඊඑම්ඒයි ඒකනායක
2022 පෙබරවාරි මස 21 දින සිට

ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරි I ලෙස

ලුතිනන් කර්නල්
අයිජේ වික්‍රමසිංහ ආර්ඩබ්ලිවීපී ආර්එස්පී යූඑස්පී
2022 ජනවාරි මස 23 දින සිට

20 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස

මේජර්
ජීඩීකේ නිශ්ශංක ආර්ඩබ්ලිවීපී ආර්එස්පී
2022 පෙබරවාරි මස 08 දින සිට

14 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස

මේජර්
පීඒටී නිරෝෂන්
2022 පෙබරවාරි මස 14 දින සිට

5 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරි ලෙස

මේජර්
කේපීසී ප්‍රනාන්දු පීඑස්සී එල්එස්සී
2022 පෙබරවාරි මස 08 දින සිට

16 (සෙව්) ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරි ලෙස

මේජර්
කේඩබ්ලිවීසේ හේමන්ත
2022 ජනවාරි මස 20 දින සිට

ලේ දන්දීමේ වැඩසටහනක්

කොවිඩ් 19 වසංගත තත්වය මත අසරණව සිටින රෝගීන්ට මෙන්ම විවිධ රෝගී තත්වයන් හේතුවෙන් රුධිරය ලබාගැනීමේ අපේක්ෂාවෙන් සිටින සිවිල් ජනතාව වෙත ශක්තියක් වෙමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෝහල් කාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කිරීමට 1 විපාරෙ ඒකකය ඉකුත් පෙබරවාරි 18 වන කටයුතු කරන ලදී.

ඒකක අණදෙන නිලධාරීගේ අදහසකට අනුව සංවිධානය කෙරුණු මෙම මාහැඟි කටයුත්තේදී 1 විපාරෙ ඒකක නිලධාරීන්, සෙනීන් 100 දෙනකු පමණ ස්වේච්ඡාවෙන්ම රුධිරය පරිත්‍යාග කළහ. තවද, මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ශ්‍රීලංකාව - වලගම්බා හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් හා සෙසුනිලයින්ද සහභාගී වූහ.

රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය, තවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජයි 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජේඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්සිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ගුප්ත දිගුව

51445/51446

'රණවිරුවා' අන්තර්ජාලය ඔස්සේ නියමිමට

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

අධීක්ෂණය

බ්‍රිගේඩියර
එච්එල්ඩී අමරතුංග
ආරක්ෂිතව ආරක්ෂක අංශයේ ඊඑසී

උපදේශකත්වය

ලුතිනන් කරනල
ඩීඑම්ඒ දිසානායක ආරක්ෂිතව්ව

ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කරනල
ඊඩීඩී සුමිත චමින්ද

සහය සංස්කාරක

කපිතාන
එච්එල්ඩබ්ලියු ලක්ෂිකා

නවත් නිවාසලාභීන් 48 දෙනකුට මූල්‍යාධාර

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 7 වන අදියර යටතේ මානුෂීය මෙහෙයුමේදී දිවිපිදූ රණවිරුවන්, රණක්ෂිතයට පත් රණවිරුවන්, විශ්‍රාමික හා සේවයේ නියුතු යුද්ධ හමුදා රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් නව නිවාස ඉදිකරදීමේ සහ අර්ධ වශයෙන් ඉදිකරනු ලැබූ නිවාසවල ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන පිරිනැමීමේ උත්සවයක් පසුගිය පෙබරවාරි 14 වන දින උදෑසන යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි. එහිදී ප්‍රතිලාභීන් 48 දෙනකු වෙත සිය නිවාස අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන පිරිනමනු ලැබීය.

මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී වූ අතර, එතුමන් මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම වෙනුවෙන් පුද්ගලිකව සිය අවධානය යොමු කරන ලදී. එහිදී, නව නිවාස 11 ක් සහ අර්ධ වශයෙන් ඉදිකරනු ලැබූ නිවාස 37 ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන පරිත්‍යාග කරන ලදී.

ඒ අතුරින් මානුෂීය මෙහෙයුමේදී දිවිපිදූ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් නිවාස 9 ක්ද රණක්ෂිතයට පත් රණවිරුවන් වෙත නිවාස 12 ක්ද තවත් නිවාස 3 ක් විශ්‍රාමික රණවිරුවන්වද නිවාස 24 ක් සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ද ප්‍රදානය කළහ. රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය සහ නිවාසලාභී රණවිරුවන්ගේ රෙජිමේන්තු ඒකාබද්ධව ආරම්භ කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය යටතේ නව නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.5 ක් සහ අර්ධ වශයෙන් ඉදිකළ නිවාසවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් 750,000.00 බැගින් ප්‍රදානය කරන ලදී.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකුද එක්වූහ.

රණබිමේ මතක

අනුරාධපුරයේ පිහිටි අභිමංසල සුවතා නිකේතනයේ ප්‍රතිකාර ලබමින් සිටින රණකෂිතයට පත් රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා පසුගියදා යුද්ධ හමුදාධිපති එහි සංචාරයක නිරත විය. එහිදී එදවස සටන් බිමෙහි බොහෝ මතක අවුස්සමින් එම රණවිරුවන් හා සතුටු සාමීචියේ නිරත වූ හෙතෙම ඔවුන් සමඟ මොහොතක් කැරම් ක්‍රීඩාවේ යෙදෙන්නටද අමතක නොකළේ යුද බිමේ ඇරඹී අතැර නොයන ලෙංගතුකම් අදටද එලෙසින්ම පවතින බව කියාපාමිනි.

අතැර නොයන ළබැඳියාව...

අතුගා දමා රුපු බලමුළු මුලින් සිඳ
පැතු ලොව දිනා දුන්නා සාමයෙන් බැඳ
මිතු දම් රැගෙන ආ යුදපති ළඟින් හිඳ
තතු පෙර මතක සිහිගන්වයි බිඳෙන් බිඳ

රොද බැඳ පෙරට ගොස් නැගි රළ සේ සයුරු
ලද ජය සටන් බිම මතකය හරි මියුරු
ඔද තෙද සිඳී ගොස් නැති විරුවන් සොයුරු
අභිමන්සලෙහි දුටුවද හිනැහෙන අයුරු

- ලුතිනන් කර්නල් ඊශ්වර් ගුණින් වතිඳු -

මහෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.